# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2127/6 - 2019 ජුනි මස 10 වැනි සඳුදා - 2019.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය :- IR/COM/05/W/2015/145

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.06.23 දිනැති හා අංක 2024/53 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.06.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, ඇරැව්වල, 650/ඒ/3 හි පදිංචි කේ. එල්. සී. හරේන්ද්‍ර මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, බෞද්ධාලෝක මාවත හි පිහිටි ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.04.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජුනි මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

කේ. එල්. සී. හරේන්ද්‍ර මයා
අංක 650/ඒ/3,
ඇරැව්වල, පන්නිපිටිය,

*පළමු වන පාර්ශ්වය*

අංකය : ඒ/23/2017

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07,

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධ ප්‍රදානයයි.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනවිරත්න ගරු අමාත්‍යතුමා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශෙෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2017.06.20 දින බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

එහෙත් ඊට පෙර එනම් 2016.09.22 දින බේරුම්කාර එස්. එම්. එස්. ජයවර්ධන මහතා බේරුම්කරු වශයෙන් පත් කිරීමේ නියෝගය අවලංගු කොට ඇත.

ඉහත කී කාර්මික ආරාවුල සඳහා හේතුවී පවත්නා කරුණ වූයේ : ''ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අළෙවි ප්‍රවර්ධන අංශයේ වැඩ බලන පාලක ලෙස සේවය කරනු ලබන කේ. එල්. සී. හරේන්ද්‍ර මහතා 2013.02.18 දින සිට ක්‍රීඩා අංශයේ පාලක ලෙස තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදු ව තිබේ ද? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

*බේරුම්කරණ ක්‍රියා වලිය :*

01. යොමුවේ සඳහන් ගැටලුව සම්බන්ධයෙන් දෙපාර්ශ්වයේ හේතු වූ උත්තර ප්‍රතිඋත්තර මගින් විමසා බැලීම.
02. යම් සමථයක් වෙත්දැයි දෙපාර්ශ්වයෙන් විමසීම.
03. වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ නීති නිලධාරිනියට වෙනත් බාහිර නීතිඥවරයෙකු සමග පෙනී සිටීමට ඉඩ සැලසීම.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත මහතෙකු සහභාගී වීම.

05. මූලික ප්‍රශ්න විමසීම, හරස් ප්‍රශ්න විමසීම හා නැවත ප්‍රශ්න කෙරෙහි ඉඩ සලසා දීම

06. ලිඛිත දේශන සඳහා ඉඩ සලසා දීම.

මෙහි දී විශේෂයෙන් සැලකිය යුතු කරුණක් වන්නේ ප්‍රදානය ආරම්භ කරන දිනය තෙක් වගඋත්තරකරු සිය ලිඛිත දේශනය ඉදිරිපත් නොකිරීමය. එසේ හෙයින් වගඋත්තරකරුගේ ලිඛිත දේශන නොමැතිව ප්‍රදානය ලබා දීමට කටයුතු කිරීමට සිදු වූ බව කණගාටුවෙන් වුවද සඳහන් කරමි.

ඉල්ලුම්කරුගේ නඩුව ඉදිරිපත් කිරීමට පළමුව ඉඩකඩ සලසා දීම :

වර්ෂ 2017.11.02 දින ඉල්ලුම්කරු දිවුරුම් පිට සිය නඩුව ඉදිරිපත් කරමින් පහත කරුණු ඉදිරිපත් කරන ලදී. එනම් :-

01. තමා 1994.01.04 වන දින සිට පුහුණු වන යතුරු ලේඛක තනතුරට වගඋත්තරකාර ආයතනයට බැඳුණු බව

02. 1997 වර්ෂයේ දී සේවය ස්ථිර වීමෙන් පසුව නිෂ්පාදක සංවිධායක, ජ්‍යෙෂ්ඨ සංවිධායක ලෙස (වැඩ බලන පාලක) ලෙස පත්වීම් ලද බව,

(අ) ඒ - 1 වශයෙන් සලකුණු කරන ලද ලේඛනය මත තමා ක්‍රීඩා අංශයේ සංවිධායක ලෙස පත්වීම් ලද බවත්,

(ආ) එවකට ක්‍රීඩා අංශයේ අංශ ප්‍රධානියෙකු නොවුයෙන් තමා එහි කටයුතු කළ බව ද,

(ඇ) ඒ - 4 ලිපිය ඉදිරිපත් කරමින් ක්‍රීඩා අංශය වෙනුවෙන් අංශ ප්‍රධානී ලෙස සඳහන් ලේඛනය ඉදිරිපත් කරමින් තමා ක්‍රීඩා අංශයේ ප්‍රධානී ලෙස සහභාගී වීම සනාථ කළ බව දක්වා සිටි බව ද,

(ඈ) ඒ - 4 (අ) ලේඛනය මත තමා කළමනාකරණ රැස්වීමේ දී ක්‍රීඩා අංශය යටතේ එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා කළමනාකාරිත්වය වගකීම් පවරන ලද බව සනාථ කළ ලිපිය ඉදිරිපත් කරන ලද බව ද, ඒ - 4 ලේඛනය කළමනාකරණ රැස්වීම් - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව යන ශීර්ෂය යටතේ වන ලේඛනයකි.

ඒ - 4 (අ) අනුව

| විෂය | තීරණය | ක්‍රියා කිරීම | අපේක්ෂිත දිනය |
|---|---|---|---|
| ක්‍රීඩා අංශය | එංගලන්ත - ශ්‍රී ලංකා ක්‍රිකට් තරඟා වලිය පිළිබඳව සැකසූ වාර්තාවක් සහ ඉදිරි සැලසුම් සකස් කිරීම. | හරේන්ද්‍ර මයා | අදම |

මෙම ඒ - 4 ලේඛනයෙහි පිටපත්

(අ) අතිගරු ජනාධිපතිතුමා

(ආ) ගරු ඇමතිතුමා ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති

(ඇ) ලේකම්තුමා ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති යන අය වෙත යොමු කොට ඇති බව

(ඉ) ඒ - 5 දරන සභාපතිගේ අංක එස් එල් බී සී/සී එච්/සී 07 සභාපති විසින් ටෙස්ට් තරඟාවලි 2012 පිළිබඳ විස්තර කථනයන් මැදිරිවල සිට ඉදිරිපත් කිරීමට දෙන ලද නියෝගය මෙම ඉල්ලුම්කරු වෙත කරන ලද දැන්වීම මගින් තමා වෙත පැවරී තිබූ රාජකාරි ස්වභාවය සනාථ කිරීම කර ඇති බව,

(ඊ) ඒ - 6 ලේඛනය ක්‍රීඩා විස්තර ප්‍රචාරය සැලසුම් පත්‍රිකාව යන මැයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ''ශ්‍රී ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරඟාවලිය 2012'' ක්‍රීඩා පාලක වන ඉල්ලුම්කරු වෙත යැවෙන ලිපියකින් තමාට එහි පවරන ලද වගකීම පැහැදිලි කිරීම.

(උ) 2012.06.16 දිනැති සභාපතිගේ අංක එස් එල් බී සී/සී එච්/සී 07/2012 දරන ලිපිය මගින් සියලු ක්‍රිකට් තරඟාවලි පිළිබඳව විස්තරයක් තමා වෙත ඉදිරිපත් කරන ලද ඒ - 7 දරන ලිපිය සංවිධායක - ක්‍රීඩා අංශය මගින් තවදුරටත් තමා ක්‍රීඩා අංශයේ සංවිධායක ලෙස කටයුතු කළ බව සභාපතිතුමා පිළිගෙන තිබීම.

(ඌ) ඒ - 8 දරන ලේඛනය - අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 මැයි 10 දින දරන ''සංස්ථාවේ වියදම් සීමා කිරීම'' යටතේ ''හරේන්ද්‍ර ලියනගේ මහතා සංවිධායක (ක්‍රීඩා)'' යනුවෙන් යොමු කරන ලද ලිපියෙන් තමා එවකට ක්‍රීඩා අංශයේ සංවිධායක ලෙස පිළිගැනීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියෙන් ඔප්පු වන බව ද,

(එ) ඒ - 9 දරන ලේඛනයෙන් සංස්ථාවේ වියදම් සීමා කිරීම යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තමා අමතන ලද ආකාරය'' හරේන්ද්‍ර ලියනගේ මහතා, සංවිධායක (ක්‍රීඩා)'' යන්නෙන් සඳහන් බව ද, සමන්ත වැලිවේරිය, අධ්‍යක්ෂ ජනරාල් 2013 මැයි 10 වන දින දරන ලිපිය සාක්ෂි දරයි.

(ඒ) ඒ - 10 ලේඛනය කළමනාකරණ රැස්වීම - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව 2011.08.22 දින'' යන ලේඛනය අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2012.03.23 දිනැති ලිපිය එනම් ක්‍රිකට් තරඟ සඳහා පැකේජ් නිකුත් කිරීම යන හිසින් යුත් ලිපිය මගින් ඉල්ලුම්කරු ''සංවිධායක ක්‍රීඩා අංශය'' යනුවෙන් අමතා ඇති බව ඔප්පු කළ හැකි බව ද, මෙහි තීරණය යන කොටුවේ ඕස්ටේලියා - ශ්‍රී ලංකා ක්‍රිකට් තරඟාවලිය ශ්‍රවණය කළ හැකි සංඛ්‍යාත පිළිබඳව අසන්නන් දැනුවත් කරන ලෙස හරේන්ද්‍ර වෙත එවකට සභාපති හඩ්සන් සමරසිංහ මහතාගේ නියෝගය අනුව මෙහි ඉල්ලුම්කරුට දෙන ලද නියෝගය පැහැදිලි වේ.

(ඔ) ඒ - 11 දරන ලේඛනය වැඩ බැලීමේ පත්වීම ලබා දී ඇති කාර්ය මණ්ඩලයේ සුදුසුකම් පරීක්ෂා කිරීම මැයෙන් යුත් ලිපිය මගින් තමා සංවිධායක ලෙස ද සහකාර අධ්‍යක්ෂ පාලනගේ 2012.10.15 දිනැති ලිපියෙන් තමා ''සංවිධායක ක්‍රීඩා අංශය'' ලෙස ද පිළිගෙන ඇති බව ද,

(ඕ) ඒ - 12 ලෙස සලකුණු කරන ලද ලේඛනය මගින් මෙම ඉල්ලුම්කරු ''පාලක ක්‍රීඩා/විධිමත් පත්වීම් ලිපියක් නැත. 2009 වර්ෂයේ සිට තනතුරේ වැඩ

බැලීම'' ලෙස පිළිගත් බව අධ්‍යක්ෂ ජනරාල්ගේ දත්ත සඳහන් ලිපියෙන් පිලිගෙන තිබීම ද,

(ක) ඒ - 13 දරන ලේඛනය මගින් මෙම ඉල්ලුම්කරු බාහිර පාර්ශ්වයකට යවන ලද ඊ - මේල් පණිවුඩයක ''අධ්‍යක්ෂ ක්‍රීඩා'' ලෙස සඳහන් කළ ලේඛනයක පිටපත් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ බව ද,

(ඛ) ඒ සම්බන්ධව නිදහසට ඉදිරිපත් කළ කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගත් බව ද, එසේ පිළිගැනීමෙන් තමා ''අධ්‍යක්ෂ ක්‍රීඩා'' ලෙස පිළිගත් බව සනාථ වන බව ද,

(ග) ඒ - 16 දරන ලේඛනය මගින් ''සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම'' හිසින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීම මගින් තමා එකී තනතුර සඳහා බලාපොරොත්තු තැබීම සිදු කළ බව ද,

03. 2012.11.08 දිනැති ඒ - 5 දරන ලේඛනයේ ''හරේන්ද්‍ර කථා කරන්න'' යනුවෙන් සභාපතිතුමා 2012.11.08 දින ලිපියේ සඳහන් වන බව ද,

04. අධ්‍යක්ෂ ජනරාල් විසින් ''හරේන්ද්‍ර කථා කරන්න'' යැයි සඳහන් ලේඛනය අනුව තමා අධ්‍යක්ෂ ජනරාල් හමුවූ බවත් තමා හැර වෙනත් කෙනෙක් ක්‍රීඩා අංශය වෙනුවෙන් සහභාගී නොවූ බවත්, ක්‍රීඩා අංශයෙන් ජාත්‍යන්තර පාසල් ක්‍රීඩා තරඟ ගුවන් විදුලි සජීවී විස්තර ප්‍රකාශ කරන බවත්, 2012.08.16 සිට 2012.08.31 දක්වා පැවති ප්‍රීමියල් ලීග් තරඟාවලියේ විස්තර ප්‍රචාරක සැලැස්ම තමා සකස් කළ බවත්, එකී ලේඛන වල ක්‍රීඩා පාලක වශයෙන් තමා අත්සන් කොට ඇති බවත් මෙම නඩුවේ ඉල්ලුම්කරු සඳහන් කරන බව ද, ''ඒ - 6(අ)'' ලේඛනයෙහි තමා ක්‍රීඩා පාලක වශයෙන් අත්සන් කොට ඇති බවත්, ක්‍රීඩා පාලක හෝ අධ්‍යක්ෂ වශයෙන් වෙනත් කෙනෙකු නොසිටි බවත් ඒ නිසාම තමාට ''ක්‍රීඩා පාලක'' ලෙස අත්සන් කළ බවත්, කාර්ය සටහන් පිටු අංක 64 හිදී සඳහන් කොට ඇති බව ද, සාක්ෂාත් කොට ඇත.

05. තව ද සලකුණු කරන ලද ලේඛන ඒ - 7 අනුව වගඋත්තරකාර ආයතනයේ සභාපති විසින් සියලු ක්‍රීඩා තරඟ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් පත්‍රිකාවක් තරඟාවලියට පෙර සභාපති වෙත ඉදිරිපත් කරන ලෙසට නියෝගයක් තමා වෙත ලබා දී ඇති බව ද, ක්‍රීඩා අංශය භාර නිලධාරියා තමා බවට සභාපතිතුමාගේ පැවැත්ම හා නියෝග ආදිය ලබා දීමේ දී ක්‍රියා කොට ලේඛන ගත කිරීම් වලින් හෙලි වන බවත්,

05. (ඒ) ඒ - 13 ලෙස ලකුණු කරන ලද ලේඛනය ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් 2012.06.15 දින සංස්ථා සභාපති වෙත යොමු කරන ලද ලිපිය ''ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ක්‍රීඩා අංශයේ ''ක්‍රීඩා අධ්‍යක්ෂ'' හරේන්ද්‍ර ලියනගේ මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ක්‍රීඩා අමාත්‍යාංශය ප්‍රණාමය පුද කර සිටියි'' ඒ අනුව අමාත්‍යාංශය මගින් පවා මෙම ඉල්ලුම්කරුහට ඔහුගේ සේවය අගය කළ බව පැහැදිලිය.

06. අධ්‍යක්ෂ (පාලන) ගේ අත්සනින් සංස්ථාව තුළ වැඩ බැලීමේ පත්වීම් ලබා දී ඇති සියලු කාර්ය මණ්ඩල නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවීම් කර 2012.10.17 දිනැති ලිපිය ඉදිරිපත් කරමින් තමාට ද සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීමට අවස්ථාව ලැබූ බවත්, ඒ - 12(ඒ) යන කොටස අනුව තමා ''පාලක ක්‍රීඩා, විධිමත් පත්වීමේ ලිපියක් නැත, 2009 වර්ෂයේ සිට ''තනතුරේ වැඩ බැලීම'' යන්න ඒ - 12 (ඒ) අනුව පැහැදිලි වන බවත් තමා ''2009 සිට වැඩ බලන පාලක'' ලෙස වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සභාපතිවරයා ද එනයින්ම පිළිගෙන ඇති බවත් සාක්ෂිකරු සනාථ කොට ඇති බවත්,

07. ඒ - 13 වශයෙන් සලකුණු කරන ලද ලේඛනයෙහි ''2013/03 දරන'' සංස්ථා මණ්ඩල රැස්වීම් වාර්තා ස්ථිර කිරීම'' යන ලේඛනයෙහි 04.03 අනු ඡේදය යටතේ ''ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංගමයේ නිලධාරීන් සමග සාකච්ඡාව යන ශීර්ෂය යටතේ ''(3) ක්‍රීඩා අංශයේ සංවිධායක වශයෙන් කටයුතු කරන හරේන්ද්‍ර ලියනගේ මහතා ''අධ්‍යක්ෂ ක්‍රීඩා'' ලෙස තනතුර සඳහන් කරමින් බාහිර පාර්ශ්වයකට යවන ලද ඊ - මේල් පණිවිඩයක පිටපතක් සංස්ථා මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.'' තවදුරටත් එකී ලිපියේ පසුපිටේ 04.04 අනු ඡේදයේ මෙසේ දැක්වේ. එනම් ''04.04 නිදහසට කරුණු විමසීම - හරේන්ද්‍ර ලියනගේ''

''සංස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ලේකම් සහ කාරක සභා සාමාජිකයන් සංස්ථා මණ්ඩලය සමග 2013.03.13 දින පැවති සාකච්ඡාවේ දී හරේන්ද්‍ර ලියනගේ මහතා විසින් ''අධ්‍යක්ෂ ක්‍රීඩා'' යනුවෙන් සඳහන් කරමින් බාහිර පාර්ශ්වයක් වෙත යවන ලද ඊ - මේල් පණිවුඩයක ඡායාස්ථ පිටපතක් සංස්ථා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.''

හරේන්ද්‍ර ලියනගේ මහතා විසින් ලබා දී නොමැති තනතුරක් වන අධ්‍යක්ෂ ක්‍රීඩා යනුවෙන් සඳහන් කරමින් බාහිර පුද්ගලයෙකු වූ ටොම් හැරිසන් මහතාට ඊ - මේල් පණිවුඩයක් යැවීම සම්බන්ධව හරේන්ද්‍ර ලියනගේ මහතාගෙන් නිදහසට කරුණු විමසීමට සංස්ථා මණ්ඩලය තීරණය කරන ලදී.''

මෙම කරුණු සම්බන්ධව හරේන්ද්‍ර ලියනගේ මහතා ඉදිරිපත් කළ නිදහසට කරුණු විමසීම ගුවන් විදුලි සංස්ථා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (පාලන) විසින් 2013.03.24 දින කරන ලදුව ඒ - 15 ලිපිය මගින් 2014.02.07 දින මෙසේ සඳහන් කර ඇත. එනම් :-

''පාලක සිටි එෆ් එම් සේවය මගින් ජ්‍යෙෂ්ඨ සංවිධායක (ටයිම් රේඩියෝ) කේ. එල්. සී. හරේන්ද්‍ර ලියනගේ මහතා,

නිදහසට කරුණු පිළිගැනීම

මගේ සමාංක හා 2013.03.25 දිනැති ලිපියෙන් කළ නිදහසට කරුණු විමසීම අනුව ඔබ විසින් 2013.03.27 දිනැති ලිපියෙන් ඒ සඳහා එවා ඇති හේතු දැක්වීම 2013.03.28 දින පැවති සංස්ථා මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව ''2013.03.28 දින පැවති සංස්ථා මණ්ඩල රැස්වීම් අංක 2013/05 හි තීරණ 05.06 මගින් ඔබ විසින් ඉදිරිපත් කළ නිදහසට කරුණු සංස්ථා මණ්ඩලය විසින් පිළිගෙන ඇති බැව් දන්වමි.''

ආර්. ඩී. නිව්ටන් පෙරේරා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)

පාලන අංශය

2014 පෙබරවාරි 07 වන දින

පිටපත ፡ පාලක සිටි එෆ් එම් සේවය''

මෙම ඒ - 15 හා ඒ - 15(බී) දරන ලේඛනයන් මගින් ගම්‍යමාන වන කරුණු කිහිපයකි. එනම්

(අ) අධ්‍යක්ෂ (ක්‍රීඩා) යන තනතුර සංස්ථා මණ්ඩලය විසින් අවිවාදයෙන් පිළිගත් බව,

(ආ) එකී තනතුරට හරේන්ද්‍ර ලියනගේ නැමති මෙම නඩුවේ ඉල්ලුම්කරු සුදුසු බවට හෝ එකී තනතුරු නාමය යොදා ගැනීම අනුමත කළ බව

(ඇ) එම අධ්‍යක්ෂ (ක්‍රීඩා) යන තනතුරු සම්බන්ධව හරේන්ද්‍ර ලියනගේ මහතා සමග සංස්ථාවේ පාලක මණ්ඩලය ප්‍රතිබන්ධනය වූ බව,

(ඈ) නිදහසට කරුණු විමසීමේ දී ඉදිරිපත් කරන ලද කරුණු පිළිගැනීමෙන් හරේන්ද්‍ර ලියනගේ මහතා සංස්ථා පාලක මණ්ඩලයට වරදක් සිදු නොකළ බව ආධ්‍යාහරයෙන් පිළිගන්නා බවයි.

(ඉ) ගුවන් විදුලි සංස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ වෘත්තීය සමිතිය මෙම ඉල්ලුම්කරුගේ ''වැඩ බලන පත්වීම ස්ථිර කිරීම'' කෙරෙහි ද්වේශයෙන් ඉදිරිපත් කළ යෝජනාව සංස්ථා මණ්ඩලය පිළිගෙන නිදහසට කරුණු විමසීමෙන් යටපත් කළ බව,

(ඉ) (1) නිදහසට ඉදිරිපත් කරන ලද කරුණු ඉල්ලුම්කරු වෙත දැන්වීම සඳහා වසරක කාලයක් ගතව ඇති බව සාක්ෂි සටහන් වල දක්වේ. ඉල්ලුම්කරු කෙරේ කටයුතු කිරීමට වගඋත්තරකරුගේ මන්දෝත්සාහී භාවය මෙයින් පැහැදිලි වේ. ඒ - 15 ලේඛනය අනුව 2013.03.25 දින සිට 2014.02.07 දින දක්වා නිදහසට කරුණු පිළිගත් බව දැන්වීමට කල් ලබා ගෙන ඇත.

(ඊ) 2013 වර්ෂයේ සිට මේ දක්වා එනම් 2019 වර්ෂය දක්වා වැඩ බැලීමේ පත්වීම ස්ථිර කිරීම සඳහා ගත යුතුව තිබූ පියවර නොගත් බව,

(උ) අධ්‍යක්ෂ (ක්‍රීඩා) යන තනතුර සම්බන්ධයෙන් නිදහසට දෙන ලද කරුණු සංස්ථා මණ්ඩලය විසින් පිළිගැනීමෙන් එකී තනතුර සඳහා හරේන්ද්‍ර ලියනගේ යන අයගේ සුදුසුකම ව්‍යංගයෙන් පිළිගැනීම ආදී කරුණු වේ.

(ඌ) සලකුණු කරන ලද ඒ - 11 ලේඛනයේ ''වැඩ බැලීමේ පත්වීම් ලබා දී ඇති කාර්ය මණ්ඩලයේ සුදුසුකම් පරීක්ෂා කිරීම'' හිසින් යුත් සහකාර අධ්‍යක්ෂ (පාලන) ගේ ලිපිය ප්‍රකාරව කටයුතු කිරීම හරේන්ද්‍ර ලියනගේ යන අයගෙන් නිදහසට කරුණු ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව එකී කරුණු සංස්ථා පාලක මණ්ඩලය පිළිගෙන ඇතත් තවදුරටත් වැඩ බැලීමේ පත්වීම යටපත්ව පැවතීම මෙම නඩුවේ ඉල්ලුම්කරුට කරන ලද අහිතකර තත්වයන් ඔහු මුදා ලීමට බේරුම්කරණ ක්‍රියා මාර්ගය ආරම්භ වන තෙක් ද අවසන්ව නැත. එය සංස්ථා පාලක මණ්ඩලය විසින් 2012, 2013 වර්ෂ වලදී ගත යුතුව තිබූ පියවරක් අතපසු කිරීමක් සේ පැහැදිලිය.

08. තවද තමන් සමග වැඩ බැලීමේ පත්වීම් ලබා සිටි අන්‍ය සේවකයින් ස්ථිර තනතුර ලබා ගත් අතර තමාට වෘත්තීය සමිතියක අසත්‍ය චෝදනාව සම්බන්ධව ක්‍රියා කිරීම හේතුවෙන් තම උසස් වීම ලබා ගැනීමට තිබූ අවස්ථාව මග හැරී ගිය බව ද, මෙම නඩුවේ පළමු පාර්ශ්වය වන හරේන්ද්‍ර ලියනගේ මහතා සාක්ෂාත් කර ඇත.

වග උත්තරකරුගේ හරස් ප්‍රශ්න ඇසීමේ දී මතු වූ කරුණු ፡

(අ) 2018.01.19 වන දින හරස් ප්‍රශ්න කෙරෙහි මුහුණ දුන් මෙම නඩුවේ ඉල්ලුම්කරු යතුරු ලේඛක සහායකවරයෙක් ලෙස ලංකා ගුවන් විදුලි සංස්ථාවට 1994 දී බැඳුණු බවත්, ආර්. - 02 දරන ලේඛනය අනුව තමන්ගේ සංස්ථාවේ ඕනෑම තනතුරකට යෙදවීමේ අයිතිය සංස්ථාව සතු බවත් පිළිගන්නා බව ද,

(ආ) තමා 1998 ඔක්තෝබර් මාසයේ ක්‍රීඩා අංශයට අනුයුක්ත වූ බවත් 2000 මාර්තු මාසය වන විට නිෂ්පාදන තනතුරකට හිමිකම් කී බවත්, ආර් - 8 දරන ලේඛනය මත 2008.06.19 දින නිෂ්පාදක තනතුරට ද පසුව සංවිධායක යන තනතුර ද තමාට ලැබුන බවත්, එය ආර් - 8 දරන ලේඛනය දෙස් දෙන බව ද ප්‍රකාශ කොට ඇත. එය කාර්ය සටහන් 93 පිටුවේ සඳහන් වේ.

(ඇ) ඉල්ලුම්කරු ජ්‍යෙෂ්ඨ සංවිධායක ලෙස ක්‍රීඩා අංශයේ සේවය කරමින් සිටිය දී අලෙවි ප්‍රවර්ධන ඒකකයට පත්වීම් ලබා ගත් බව ද, 2012.06.16 දිනට පසුව තමා හට ''ජ්‍යෙෂ්ඨ සංවිධායක'' යන තනතුර ලැබුණ බවත්

(ඈ) නඩු ගොනුවේ අංක 113 පිටුව මෙසේ සඳහන් වේ. හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙන ඉල්ලුම්කරු ''ප්‍ර ፡ දැන් වැඩ බැලූ තනතුරක් ලිඛිතව වැඩ බැලීමක් ඔබට නෑ.

උ ፡ ලිඛිතව පිළිගැනීමක් තිබෙනවා සංස්ථා මණ්ඩල පත්‍රිකාවේ ''2009 වර්ෂයේ සිට බැඩ බැලීම'' කියලා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ දුන් උපදෙස් අනුව පිළිඅරගෙන තියෙනවා.''

ප්‍ර ፡ ලිඛිතව වැඩ බැලීමක් නැහැ නේ ද?

උ ፡ ලිඛිතව පිළිගෙන තියෙනවා 2009 වර්ෂයේ සිට (කාර්ය සටහන් 113 පිටුව) ඒ - 12 දරන සංස්ථා මණ්ඩල පත්‍රිකාවේ 03 වන කොටුවේ'' හරේන්ද්‍ර ලියනගේ මහතා පාලක ක්‍රීඩා විධිමත් පත්වීම් ලිපියක් නැත. 2009 වර්ෂයේ සිට තනතුරේ වැඩ බැලීම'' යනුවෙන් ලිඛිතව සඳහන් වේ. ඒ අනුව තමා 2009 සිට වැඩ බලන ලද බව ඔප්පු වන බව ද, එය සභාපති ඇතුළු සංස්ථා පාලක මණ්ඩලය පිළිගන්නා බව තහවුරු වන බව ද, සාක්ෂාත් කර ඇත.

13. යොමු වේ සඳහන් පරිදි ''හරේන්ද්‍ර මහතා 2013.02.18 දින සිට ක්‍රීඩා අංශයේ පාලක ලෙස තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද යන්නට පෙර සිටම ක්‍රීඩා අංශයේ පාලක ලෙස ස්ථිර නොකිරීම යන කරුණ කෙරෙහි සැලකිල්ල දක්වීමට කරුණු ද සලකුණු කරන ලද ලේඛන මගින් පැහැදිලි වේ. එනම් ''ඒ - 10'' වශයෙන් සලකුණු කරන ලද ලේඛනය 2011.08.22 දිනැති කළමනාකරණ රැස්වීම

- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව යන ශීර්ෂයෙන් යුත් ලිපියේ සහභාගී වූවන් අතර ''සංවි - ක්‍රීඩා'' යන්නෙන් මෙම ඉල්ලුම්කරු සහභාගී වූ බවට සාක්ෂි ඇත. එකී ලේඛනයේ විෂය/තීරණය/ක්‍රියා කිරීම/අපේක්ෂිත දිනය වශයෙන් තීරු 04 කි. 03 වන කොටුවේ ක්‍රිකට් විස්තර ප්‍රචාරය/යන විෂයය යටතේ තීරණය පහත පරිදි වේ.

| විෂය | තීරණය | ක්‍රියා කිරීම | අපේක්ෂිත දිනය |
|---|---|---|---|
| ක්‍රිකට් විස්තර ප්‍රචාරය | ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා ක්‍රිකට් තරඟා වලිය ශ්‍රවනය කළ හැකි සංඛ්‍යාත පිළිබඳව අසන්නන් දැනුවත් කරන නිවේදන සියලු සේවාවන් වල ප්‍රචාරනය කිරීමට කටයුතු යෙදීම තෙන්ඩුල් සේවය ඔස්සේ ද ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම | හරේන්ද්‍ර මයා | නොපමාව |

මෙම ඒ - 11 මගින් තමා වෙත 2013 වර්ෂයේ ද ක්‍රීඩා අංශයේ වගකීම් පවරා ඇති බව මෙම නඩුවේ ඉල්ලුම්කාර හරේන්ද්‍ර නැමති අය හෙළි කළ බව ද,

14. ඒ - 12 දරන ලේඛනය මෙසේ ය.

''හරේන්ද්‍ර ලියනගේ මහතා සංවිධායක,

2013.01.11 දින ක්‍රීඩා විකාශයේ විකාශන කටයුතු

උක්ත කරුණ සම්බන්ධයෙන් විස්තර ලබා ගැනීම සඳහා 2013.01.18 දින (අද දින) පස්වරු 2.00 - 3.00 අතර මා හමුවන ලෙස දන්වමි.'' යන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පාලනගේ 2013.01.18 දින ලිපියෙන් ක්‍රීඩා අංශයේ විකාශන කටයුතු මෙම ඉල්ලුම්කරු වෙත පවරා තිබූ බව ද,

15. මෙම බේරුම්කරණ ක්‍රියාදාමය ආරම්භ වූවාට පසුව ඉල්ලුම්කරුව ප්‍රවර්ධන අංශයට හා ප්‍රකාශන අංශය යන අංශ දෙකකට ස්ථාන මාරු ලබා දුන් බවත් (කාර්ය සටහන් 125 පිටුව)

16. නැවත ප්‍රශ්න වලට පිළිතුරු දෙන ඉල්ලුම්කරු නිෂ්පාදක, සංවිධායක, ජ්‍යෙෂ්ඨ සංවිධායක හා වැඩ බලන පාලක වශයෙන් නියමිත ක්‍රමවේදයට අනුව තමා පැමිණ සිටින බව ද, (කාර්ය සටහන් පිටු අංක 145)

17. ක්‍රීඩා අංශයේ පාලක තනතුර නිසි කාලයට නොලැබීම මත බරපතල වශයෙන් ''අධ්‍යක්ෂ'' යන උසස් වීම නොලැබී ගිය බව ද සාක්ෂි මගින් හෙළි කරනු ලැබිය.

ඉල්ලුම්කරුගේ නඩුව 2018.06.19 දින අවසන් කලෙන් වගඋත්තරකාර පාර්ශ්වයට සිය නඩුව ආරම්භ කරන ලෙසට නියෝග කළෙමි.

වගඋත්තරකරුගේ ස්ථාවරය :-

වගඋත්තරකාර පාර්ශ්වය මේ අවස්ථාවෙහි සමථයක් පිළිබඳව යෝජනා කරන ලදී. ඒ සඳහා ඉඩ ලබා දෙන ලදී.

ඒ අනුව ඉල්ලුම්කාර සේවක මහතාට 2013.02.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි හිඟ වැටුප් ගෙවීමකින් තොරව පාලන තනතුරට පත් කිරීම සඳහා වගඋත්තරකාර පාර්ශ්වය තීරණය කොට ඇතත් ඊට ඉල්ලුම්කාර පාර්ශ්වය එකඟතාවය පළ නොකරන ලදී. ඒ අනුව වගඋත්තරකාර පාර්ශ්වය සාක්ෂි කැඳවන්නේ ආයතනයේ අධ්‍යක්ෂ (පිරිස්) එම්. එච්. ඒ. එම්. පද්මසිරි යන සාක්ෂිකරු විසින් සලකුණු කරන ලද ආර් 01 - 03 ශ්‍රේණියේ යතුරු ලේඛක තනතුරට ඉල්ලුම්කරු පත් කිරීම.

ආර් - 02 - යතුරු ලේඛක තනතුර ස්ථිර කිරීම.

ආර් - 04 - නිෂ්පාදක තනතුරේ පුහුණුව ලබා දීම.

ආර් - 05 - නිෂ්පාදක තනතුරට පත් කිරීම.

ආර් - 06 - වවුචර් මුදල් අංශයට යැවීම සම්බන්ධ රාජකාරි.

ආර් - 07 - වෙළඳ සේවයට මාරු කිරීම.

ආර් - 08 - සංවිධායක තනතුර ලබා දීම.

ආර් - 09 - ජ්‍යෙෂ්ඨ සංවිධායක තනතුර පිරිනැමීම.

ආර් - 14 - සංස්ථා මණ්ඩල පත්‍රිකාව අනුව සංස්ථාවේ වැඩ බලන ලද 44 දෙනෙකුගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා කටයුතු කිරීම.

ආර් - 17 - සංස්ථා මණ්ඩල රැස්වීම් වාර්තාවේ පිටපත.

ආර් - 18 - අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව

ආර් - 19 - හරේන්ද්‍ර ලියනගේ මහතාට 2013.02.18 සිට පාලක තනතුරේ හිඟ වැටුප් ගෙවීමකින් තොරව පත් කිරීමට වූ තීරණය

(කාර්ය සටහන් 192 පිටුව)

ආර් - 20 - පත්වීම් නොලැබීම නිසා ඉල්ලුම්කරුට වූ මූල්‍යමය හානිය කීයක් ද යන්න සඳහන් ලිපිය -

ආදී ලේඛන මේ මොහොත දක්වා ගොනුවට ඉදිරිපත් කොට නැත. තවද වගඋත්තරකරුගේ ලිඛිත දේශන භාර නොදී තිබීම හේතුවෙන් එකී ලේඛනයන්හි අඩංගු කරුණු විමසා බැලීමට ඉඩක්ද නොපවතී. එසේ හෙයින් සාක්ෂිකරුගේ ප්‍රකාශ මත යැපීමට සිදුවී ඇත. ප්‍රදානය ලබා දීමේදී විශේෂයෙන් වග උත්තරකරු සලකුණු කරන ලද ලේඛන නොමැතිව ක්‍රියා කිරීමට සිදු විය.

වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ (පාලන) ගේ සාක්ෂිය අනුව සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී,

ඒ - තමා කම්කරුවෙකු ලෙස වගඋත්තරකාර ආයතනයට 1994.07.13 දින බැඳුන බවත්, (පිටුව 184)

වර්තමාන තනතුර අධ්‍යක්ෂ (පාලන) බවත් කීය. තමා මානව හිමිකම් කොමිසම ඔස්සේ අධ්‍යක්ෂ තනතුර ලබාගත් බවත් කී ය.

(බී) මෙම සාක්ෂිකරු ඒ - 2 ලිපිය ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩු වී ඇති බැවින් මෙම සේවාවන් සිදු කරන ගෙවීම අනුමත කරන නිලධාරීන් පත් කිරීම ඒ - 2 ලිපියෙන් සිදු වන බව ද,''

''ඒ නිලධාරීන් අතර මේ ඉල්ලුම්කරුත් ගෙවීම් කටයුතු සඳහා අධ්‍යක්ෂවරයෙකුගේ බලය දුන් බව ඒ- 2 ලිපියෙන් තහවුරු වන බව ද සාක්ෂිකරු පිළිගනී. මුදල් ගෙවීමේ අධ්‍යක්ෂවරයා සතු බලය මේ නඩුවේ ඉල්ලුම්කරුට ලිඛිතව ලබා දී ඇති බවත්, ඒ - 4

මගින් අංශ ප්‍රධානීන් සහභාගී වූ බව ද, ක්‍රීඩා අංශය වෙනුවෙන් හරේන්ද්‍ර මහතා ඉල්ලුම්කරුට ලිඛිතව මුදල්ගෙවීමට අනුමැතිය දී ඇති බවද තහවුරු කළේය.

(සී)- (නඩු ගොනුවේ අංක 204 පිටුව) ඒ- 1, ඒ - 2, ඒ -3, ඒ- 4 ඒ 5, ඒ -6, ඒ. - 7 ඒ- 8සහ ඒ- 9 යන ලේඛන කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කරයි.

''ප්‍ර'' ඔය සියලු ලේඛන නිකුත් කරලා තියෙන්නේ වගඋත්තකාර ආයතනයේ වගකිව යුතු ඉහළ නිලධාරින් බව පිළිගන්නවා ද?

පි : ඔව්

ප්‍ර : ද ැන් ඔය ඉහත සඳහන් කළ ලේඛන අනුව හරේන්ද්‍ර ලියනගේ මහතා හැර ක්‍රීඩා අංශයේ පාලක තනතුරේ වැඩ බැලූ වෙනත් කිසිම කෙනෙක්ට එවැනි ලිපි නිකුත් කරලා තියෙනවා ද?

පි : ක්‍රීඩා අංශය වෙනුවෙන් එවැනි ලිපි නිකුත් කරලා නැහැ'' ආදී වශයෙන් මෙම නඩුවේ ඉල්ලුම්කරු ක්‍රීඩා අංශයේ ප්‍රධානී බවට වගඋත්තරකාර ආයතනයේ පාලන අධ්‍යක්ෂවරයා අනාවරණය කළේය.

(ඩී) එහෙත් මෙම සාක්ෂිකරු පාලන අධ්‍යක්ෂ වුව ද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ''විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක්'' සොයා ගැනීමට නොමැති බැව් සඳහන් කිරීම හාස්‍යයට කරුණකි. මෙයින් ගම්‍යමාන වන කරුණක් වන්නේ එක්කො කරුණු වසන් කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් නොමැති බව හෙළි කළා විය හැක. නැතහොත් මෙම නඩුවේ ඉල්ලුම්කරුට වාසියක් වීම වැළැක්වීමට සිතාමතා ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටියක් නොමැති බැව් සඳහන් කළා විය හැකි ය.

මෙම සාක්ෂිකරු පෙර විභාග දිනය වූ 2018.10.28 දිනයේ ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටිය ඊළඟ විභාග දිනය වූ 2019.01.16 දිනට ඉදිරිපත් කරන බවට සපථ කොට සිටිය ද, එදින ද, එය ඉදිරිපත් කළේ නැත.

(ඉ) තව ද, ඒ - 11 ලේඛනයට අදාළ ලිපි ගොනුවද සාක්ෂි දීමට පැමිණෙන පාලන අධ්‍යක්ෂ වූසාක්ෂිකරු ගෙනවිත් නොමැති බැවින් නිවැරදිව සාක්ෂි දීමට නොහැකි බව නඩු ගොනුවේ 211 පිටුව සනාථ කරයි.

(එෆ්) ඒ- 16 ලෙස සලකුණු කරන ලද ලිපිය හරේන්ද්‍ර මහතා ආමන්ත්‍රණය කරමින් හෝ සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) තනතුරට බඳවා ගැනීමේ සිරසින් යුත් මෙම සාක්ෂිකරු වූ පාලන අධ්‍යක්ෂ නිකුත් කර ලද ලිපියක් ඉල්ලුම්කරු වූ හරේන්ද්‍ර නමැති අය සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) සඳහා බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණයකට 2011.12.20 දිනට කැඳවන ලද්දකි. ඒ- 16 අනුව හරේන්ද්‍ර මහතා සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ඇතත් එය නියමිත පරිදි නොපැවති බවත් ඒ නිසාම හරේන්ද්‍ර මහතාට අගතියක් සිදු වී ඇති බවත් නඩු ගොනුවේ 220 පිටුවේ දක්වේ. සාක්ෂිකරු විසින් හරේන්ද්‍ර මහතා සම්බන්ධව ක්‍රියා නොකිරීමෙන් මහත් අගතියක් වූ බව පිළිගනී (222 පිටුව)

විශේෂ කරුණක් : එනම් වගඋත්තරකාර පාර්ශ්වයේ නඩුව අවසන් කළ 2019.02.18 දින දෙපාර්ශ්වයේ ලිඛිත දේශන සමඟ තම තමන්ගේ සලකුණු කරන ලද ලේඛන 2019.03.22 දින හෝ ඊට පෙර බේරුම්කරණය වෙත ගොනු කරන මෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත ඉල්ලා ඇතත් මෙම ප්‍රදානය ලියා අවසන් කරන තෙක් වගඋත්තරකාර පාර්ශ්වයේ ලිඛිත දේශන හා සලකුණු කරන ලද ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම ගැන කණගාටුව පළ කරන ලද අතර සාක්ෂිකරුගේ එනම් අධ්‍යක්ෂ (පාලන) ගේ සාක්ෂියේ දී පළ කරන ලද කරුණු ප්‍රයෝජනයට ගැනීමට සිදු විය.

ප්‍රදානය කෙරෙහි බලපෑ නෛතික පසුබිම

i. දෙපාර්ශවයේ ස්ථාවරයන්

ii. විශ්ලේෂණය කළ යුතු නෛතික කරුණු

iii. ඉල්ලුම්කරුගේ විත්ති වාචකය

iv. දෙවන පාර්ශවයේ මූලික ස්ථාවරය ප්‍රතිබන්ධනය වීමක් ඇත් ද,

v. වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු වූ අධ්‍යක්ෂ (පාලන) ගේ සාක්ෂිය මගින් ඉස්මතු වූ කරුණු ආදියයි

මේ අනුව යොමුව කෙරෙහි නැවතත් හැරී බලමු.

එනම් ''ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අලෙවි ප්‍රවර්ධන අංශයේ වැඩ බලන පාලක ලෙස සේවය කරනු ලබන කේ. එල්. සී. හරේන්ද්‍ර මහතා 2013.02.18 වන දින සිට ක්‍රීඩා අංශයේ පාලක ලෙස තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද? එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ'' හරේන්ද්‍ර මහතා 2013.02.18 වන දින සිට ක්‍රීඩා අංශයේ පාලක ලෙස තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් ඒ මහතාට සිදු ව ඇත යන්න මාගේ පිළිතුර වේ. ඊට හේතු වූ ඉල්ලුම්කරුගේ සාක්ෂිය හා ලේඛන මගින් සාකච්ඡාවට භාජනය කල අතර තවදුරටත් වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගේ සාක්ෂිය හා ඉදිරිපත් කරන ලද ලේඛණ ද සැලකිල්ලට ගනිමින් යොමුවේ පළමු පැනයට ඔව් යන්න පිළිතුර ලබා දෙමි.

යොමු වේ සඳහන් දෙවන පැනය වූ අසාධාරණයක් සිදු වුණේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්න මෙතැන් සිට සැලකිල්ලට ගනිමි.

(අ) 2018.08.29 දින විභාගය ආරම්භයේම වගඋත්තරකාර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නීති නිලධාරිනිය සමඟ පෙනී සිටි නීතිඥ ඉසුරු ලක්පුර මහතා ''මෙම නඩුවේ ඉල්ලුම්කරු වෙත 2013.02.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි හිඟ වැටුප් ගෙවීමකින් තොරව පාලක තනතුරට පත් කිරීම සඳහා වගඋත්තරකාර ආයතනය තීරණය කර ඇත.'' යන සමථ කොන්දේසිය ද සලකා බැලීම වටී. එමගින් වගඋත්තරකාර පාර්ශවය යම් ප්‍රමාණයකට ඉල්ලුම්කරුගේ නඩුව ජය අත් කර ඇති බවට ඉඟියක් පෙන්නුම් කෙරේ.

(ආ) එම සමථ කොන්දේසිය ගෙන ඒමේ දී ''හිඟ වැටුප් ගෙවීමකින් තොරව'' යන කොන්දේසිය නොවී නම් බේරුම්කරණ විභාගය එදිනම නිම වීමට තිබිණ.

(ඇ) ඉල්ලුම්කාර පාර්ශවයේ ස්ථාවරය ශාක්‍යතා වැඩිබර සාක්ෂි මඟින් .තහවුරු කර තිබීම.

(ඈ) දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරුගේ ස්ථාවරයට හබ කරමින් අභියෝගයට ලක් කර නොතිබීම.

(ඉ) දෙවන වගඋත්තරකාර පාර්ශවය පළමු පාර්ශවය ගෙන තිබූ කරුණු ශාක්‍යතා වැඩි බර සාක්ෂි මඟින් තහවුරු කොට නොතිබීම.

(ඊ) මෙම නඩුවේ ඉල්ලුම්කරු උපාධිධාරියෙකු, පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු හා ක්‍රිකට් විනිසුරු වරයෙකු ලෙස වසර 25 කට අධික පළපුරුදු සංස්ථා නිලධාරියෙකු බවත් 2009 වර්ෂයේ සිට ක්‍රීඩා අංශයේ පලපුරුදු නිලධාරියෙකු බවත් පැහැදිලි කොට තිබීම.

(උ) වගඋත්තරකාර සංස්ථාවේ කම්කරුවෙකු ලෙස සේවට බැඳුණු පද්මසිරි මහතා මේ වන විට අධ්‍යක්ෂ (පාලන) ලෙස හෙබවීම අගය කරන අතර මෙම නඩුවේ ඉල්ලුම්කාර හරේන්ද්‍ර මහතා උපාධිධාරියෙකු පශ්චාත් උපාධිධාරියෙකු දක්වා අධ්‍යාපනයෙන් පෝෂණය ලබා ඇති හෙයින් ද, ක්‍රීඩා අංශයේ පලපුරුදු නිලධාරියෙකු ලෙස ද, පවත්නා යෝග්‍යතාවය තවදුරටත් ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම ඖචිත්‍ය කරුණක් වීම ආදී කරුණු ප්‍රදානයේ දී සැලකිල්ලට ගන්නා ලදී.

### ප්‍රදානය

මෙතෙක් දීර්ඝ වශයෙන් කරන ලද සාකච්ඡාව හා සැලකිල්ලට ගන්නා ලද කරුණු ද සලකා බලා යොමුවේ සඳහන් පැනයට ''ඔව්' යන පිළිතුර ලබා දෙමි. එසේනම් ඔහුට ලබා දිය යුතු සහන කවරේද යන්නට දූන් පිළිතුරු සැපයීම ද වටී.

01. මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරු 2013.02.18 සිට ක්‍රීඩා අංශයේ වැඩ කටයුතු ආවරණය කළ කාලයට අදාළ දින සිට අධ්‍යක්ෂ ක්‍රීඩා තනතුරට පත් කොට එකී තනතුරට අදාළ හිඟ වැටුප් සහිතව ගෙවීම් සිදු කරන ලෙස 2017.07.17 දිනැති ඉල්ලුම්කරුගේ විස්තර ප්‍රකාශයෙන් ඉල්ලා ඇත. ඒ සඳහා ක්‍රියා කිරීම හා ඒ - 12 නමැති සංස්ථා මණ්ඩල පත්‍රිකාවේ ඒ - 12 (ඒ) නම් වූ සලකුණු කරන ලද ලේඛනයේ ඉල්ලුම්කරු 2009 වර්ෂයේ සිට ''තනතුරේ වැඩ බැලීම'' යන ශීර්ෂයෙන් වැඩ බලන ලද කාලය වර්ෂ 2009 සිට යයි දක්වේ. ඒ අනුව වැඩ බැලීමේ කාලය යොමුවේ සඳහන් දිනය එනම් 2017.07.17ලෙස සඳහන් වුව ද සංස්ථා මණ්ඩල ''2009 වර්ෂයේ සිට වැඩ බැලූ බවට කරන හෙළි කිරීම මත ඉල්ලුම්කරුට සහන සැලසීම 2009 වර්ෂයේ සිට ආරම්භ විය යුතු බවට අදහස් කරමි.

02. එසේ නොවන්නේ නම් දැනට සේවය කරනු ලබන අලෙවි ප්‍රවර්ධන අංශයේ අධ්‍යක්ෂ තනතුරට පෙරදාතම් කොට පත්කොට එදින සිට හිඟ වැටුප් ලබා දීමට ද,

03. අධ්‍යක්ෂ ධූරය හා ඊට අදාළ වැටුප් සමඟ හිඟවැටුප් සහ වගඋත්තරකාර ආයතනයේ සහ රජයේ නියම කරන ලද වැටුප් වැඩි වීම් සමඟ එකී තනතුරට අදාළ වෙනත් ගෙවීම් ඇතොත් ඒ සියල්ල සමඟ අධ්‍යක්ෂ ධූරයක පිහිටු වීම නිර්දේශ කරමි.

04. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ''සේවක මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටිය'' මෙම අධිකරණයට ඉදිරිපත් කොට නොතිබීම හේතුවෙන් ක්‍රීඩා අංශයේ ''අධ්‍යක්ෂ ක්‍රීඩා'' තනතුරක් වෙත්දැයි පැහැදිලිව තීරණයක් ගත නොහැකි විය. ඒ කරුණ මත ක්‍රීඩා අංශයේ අධ්‍යක්ෂ (ක්‍රීඩා) තනතුරක් නොවන්නේ නම් දැනට ඉල්ලුම්කරු සේවය කරන අලෙවි ප්‍රවර්ධන අංශයෙන් අධ්‍යක්ෂ (අලෙවි ප්‍රවර්ධන) තනතුරට පත් කොට ක්‍රීඩා අංශයේ ද කටයුතු කිරීමට මෙම නඩුවේ ඉල්ලුම්කරු ඊට අද ාළ හිඟ වැටුප් හා වෙනත් දීමනා සහිතව පත් කිරීමට නියෝග කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් ලිත් මසක් තුළ ක්‍රියාත්මක කිරීමට ද වගඋත්තරකාර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බැව් සහතික කරමි.

බේරුම්කරු.

2019.04.25

06-712

---

මගේ අංකය : - IR/22/29/2012

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.09.09 දිනැති හා අංක 1983/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.09.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් වැලිකන්ද, බී - කලාපය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙ හි ටී. එම්. නන්දසෝම මයා, සිංහපුර, බී - කලාපය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙ හි එච්. පී. කේ. යූ. පතිරත්න මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.05.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජුනි මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

01. ටී. එම්. නන්දසෝම මයා,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
'බී' කලාපය,
වැලිකන්ද

02. එච්. පී. කේ. යූ. පතිරත්න මයා,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
'බී' කලාපය,
සිංහපුර.

බේරුම්කරණ අංක : 3663 ඉල්ලුම්කරුවන්

IR/22/29/2012 සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක : 500, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

වගඋත්තරකරු

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනවිරත්න ගරු අමාත්‍යතුමා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016.09.02 දින මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත දෙපාර්ශවය අතර පවත්නා කාර්මික ආරවුල මෙසේ සඳහන් කොට ඇත. එනම් ''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 'බී' කලාපයට අනුයුක්ත කාර්යාල කාර්ය සහායක ලෙස සේවය කරන ටී. එම්. නන්දසෝම මයා සහ එච්. පී. කේ. යූ. පතිරත්න මයා යන කනිෂ්ඨ සේවකයන් යතුරු ලේඛක තනතුර සඳහා පත් කිරීමට 1991 පවත්වන ලද පරීක්ෂණයෙන් සමත්ව තිබියදී එම තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී ඇද්ද යන්න සහ එලෙස අසාධාරණයක් සිදු ව ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමි විය යුතු සහනයන් මොනවාද යන්න වේ.''

යොමුවෙන් බැලූ බැල්මට ගම්‍යමාන වන කරුණු :-

(අ) ඉල්ලුම්කරුවන් දෙදෙනාම ''පත් කිරීමට 1991 පවත්වන ලද පරීක්ෂණයෙන් සමත් ව තිබීම.''

(ආ) එහෙත් එම තනතුරෙහි මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාම නොපිහිටුවීම,

(ඇ) එමගින් අසාධාරණයක් සිදු ව ඇද්ද යන වග

*බේරුම්කරණ ක්‍රියාපටිපාටිය*

(1) ආරවුල සම්බන්ධයෙන් අවස්ථා දෙකකදී විස්තර ප්‍රකාශ ලබා ගෙන ඒවාට උත්තර ප්‍රතිඋත්තර සැපයීමට පාර්ශ්වයන්ට ඉඩ ලබා දීම.

(2) පාර්ශ්වයන්ට නියෝජිතයකු හෝ නීතිඥ සහාය ලබා ගැනීමට ඉඩ සැලසීම.

(3) දෙපාර්ශ්වයටම මූලික සාක්ෂි විමසීමට හරස් ප්‍රශ්න හා නැවත ප්‍රශ්න විමසීමටත් අවසානයේ ලිඛිත දේශන මගින් සලකුණු කරන ලද ලේඛන හා අදාළ කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ ලබාදීම ආදිය වේ.

විස්තර ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් හෙළි වූ කරුණු :-

(A) ඉල්ලුම්කාර ටී. එම්. නන්දසෝම මහතා කාර්යාල කාර්ය සහායක ලෙස 1982.06.21 සිටද, ඉල්ලුම්කාර එච්. පී. කේ. යූ. පතිරත්න මහතා කාර්යාල කාර්ය සහායක ලෙස 1986.04.01 දින සිටද බඳවා ගත් බව,

(B) වගඋත්තරකාර ආයතනයේ පුරප්පාඩුව පැවති ''සිංහල යතුරු ලේඛක'' තනතුරුවල සේවයේ යොදා ගත් බව,

(C) කලාපය තුළ පැවති යතුරු ලේඛක පුරප්පාඩු පිරවීම සඳහා 1991 අයදුම්පත් කැඳවීමේ දී මේ දෙදෙනාම ඉදිරිපත්ව අදාළ සම්මුඛ පරීක්ෂණවලින් සමත්ව තිබියදීත් පත්වීම් ලබාදීමට කටයුතු නොකළ බව,

(D) උසස්වීම් ලබාදීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් තත්කාලයේ නොමැතිවුවද ලබා ඇති පළපුරුද්ද හා සේවා කාලය සලකා උසස්වීම් ලබාදීමට හැකි බවට නේවාසික කළමනාකරුවන් වහසි බස් දෙඩූ බවද,

(E) යතුරු ලේඛක හා ලිපිකාර රාජකාරියේ මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාම අදාළ නේවාසික කළමනාකරුවන් විසින් අගය කර තිබීම.

මත උසස්වීම් ලබා දිය යුතු බවට ඉල්ලුම්කාර පාර්ශ්වය තර්ක කර සිටී.

වගඋත්තරකාර පාර්ශවයේ තර්කය වූයේ,

(A) කෙසේ වෙතත් ''1991 වර්ෂයේ දී පවත්වන ලද පරීක්ෂණයක් මුල් කර ඇති අතර මේ වන විට වසර 25 ක කාලයක් ගතව ඇති බැවින් මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා ගැනීමට අපහසු වී ඇත.'' යනුවෙන් 2016.10.21 වන දින දෙවන පාර්ශ්වයේ වගඋත්තරකරුගේ නීතිඥ රම්‍යා රාජපක්ෂ මිය සඳහන් කොට ඇත.

(B) 2016.12.09 දිනැති විස්තර ප්‍රකාශයේ 4 වන ඡේදය මෙසේ ය. ''ඒ අනුව 1991 වසරේ මහවැලි ආර්ථික ඒජන්සිය විසින් පවත්වන ලද යතුරු ලේඛක තරග විභාගය සම්බන්ධයෙන් (වසර 25ක් පැරණි) කරුණු ඉදිරිපත් කළ නොහැකි බැව් ගෞරවයෙන් සැළ කර සිටිමි.''

(C) ''කෙසේ වෙතත් පළමු පාර්ශ්වය තම අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා අප්‍රමාදව ඉදිරිපත් වී නොමැති බැවින් undue delay සිද්ධාන්තය යටතේ මෙම නඩුව මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභා විය යුතු බව ගරු අධිකරණයේ අවධානයට යොමු කර සිටිමි.''

(D) ''මේ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලීම කාලාවරෝධී වී ඇති බවද ගෞරවයෙන් සැළ කර සිටිමි.'' යන කරුණු වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් හෙළි විය.

*බේරුම්කරණ විභාග පටිපාටිය*

(I) 2016.12.09 වන දින විභාග අවස්ථාවේදී මෙම ගැටලුව සම්බන්ධයෙන් සමථයක් වෙත්දැයි විමසීම හා ඊට නිසි පිළිතුරක් ලබා ගැනීම සඳහා වගඋත්තරකාර පාර්ශ්වයට ඉඩ ලබා දීම.

(II) 2017.02.07 දින එසේ සමථයක් නොමැති බැව් හෙළිවීම.

(III) ඒ හේතුවෙන් විභාගය ආරම්භ කිරීම ආදී කරුණු මෙහිදී වැදගත් බැව් සලකමි.

ඉල්ලුම්කාර පාර්ශ්වයට තම නඩුව ආරම්භ කිරීමට නියෝග නිකුත් කිරීම හා මූලික සාක්ෂි සඳහා ඉඩ ලබා දීම යන පියවර යටතේ සිදු විය.

(1) ඉල්ලුම්කාර ටී. එම්. නන්දසෝම මහතාගේ මූලික සාක්ෂිය හා හෙළි වූ කරුණු,

(A) තමා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 'බී' කලාපයේ 1982.06.21 දින සිට අනියම් පණිවුඩකරුවෙකු වශයෙන් අනියම් තනතුරකට බැඳුන බවත්, 1986.03.01 සිට ස්ථිර සේවයට බැඳුනු බව, යතුරු ලේඛක කටයුතු වලද අමතරව නියැලෙන්ට සිදු වූ බවත් වර්ෂ 8 ක පළපුරුද්ද මත තමා යතුරු ලේඛක තනතුර සඳහා අයදුම් කළ බව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කොළඹ කාර්යාලය වෙත සම්මුඛ පරීක්ෂණයකට කැඳ වූ බවත්, ඉන් තමා සමත් වූ බවත්, ලිපිකරු තනතුරේ රාජකාරි ආවරණය කිරීමට තමා පත් කළ බවත්, 2007.07.17 දිනය වන විට වසර 10ක් යතුරු ලේඛක හා ලිපිකරු තනතුරේ සේවය කළ බවත්, ආයතනයේ ගබඩා සහකාර තනතුර සඳහා අයදුම් කළ බවත්, ආයතනයේ ගබඩා සහකාර තනතුර සඳහා අයදුම් කළත්, එයද තමාට ලබා නොදුන් බවත් 1991 සිට 2015 දක්වා තමා ආවරණය කළ යතුරු ලේඛක තනතුර හෝ ලිපිකාර තනතුර සඳහා කරන ලද ඉල්ලීම A01 සිට A15 දක්වා සලකුණු කළ බවද සාක්ෂිකරු තහවුරු කර ඇත. ඒ අනුව වගඋත්තරකාර ආයතනයේ තර්කය වූ මෙම ඉල්ලුම්කරු ක්‍රියා නොකර සිටි බව බිඳ හෙළා ඇත. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කළමනාකාර, පරිපාලන සහකාරතුමා සමග පැවති සාකච්ඡාවේදී තමාට ලිපිකාර රාජකාරි කටයුතු පැවරූ බව A16 ලේඛනය ඉදිරිපත් කරමින් කියා සිටී.

තවදුරටත් සාක්ෂිකාර ඉල්ලුම්කරු හරස් ප්‍රශ්න සඳහා මුහුණ දෙමින් (2017.05.05 දින කාර්ය සටහන් 85 පිටුව) හා (91 පිටුව) තමාට ගබඩා සහකාර තනතුර, යතුරු ලේඛක තනතුර ලබා නොදීම හා වන්දි ලබා ගෙන තනතුරෙන් අස්වීමට ඉඩ නොදීම යන කරුණු තුනම ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තියට අනුකූල බැව් සාක්ෂිකරු කියා සිටියේ ය. 2006 (1) රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය සාක්ෂිකරු ඉදිරිපත් කරමින් සේවයේ යෙදී සිටින අයගේ අඩුපාඩු ඇතොත් වසර 03 ක් සේවය කර ඇත්නම් තනතුර ලබා දිය යුතු බවට සඳහනක් ඒ 8 දරන ''රාජ්‍ය ආයතන සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයන් ස්ථිර කිරීම'' යන ශීර්ෂයෙන් යුත් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමාගේ 2007.07.17 දිනැති චක්‍ර ලේඛ අංක 21/2006 හි 'ආ' ඡේදය මෙසේය. ''අදාළ තනතුරේ බඳවා ගැනීමේ පරිපාටියේ නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති වුවද පුරප්පාඩු තනතුරක 2006.11.01 දිනට සතුටුදායක සහ අඛණ්ඩව අවුරුදු තුනක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් දින 03 කදී සේවයේ ස්ථිර කළ යුතු බවට තර්ක කොට ඇත. (නඩු ගොනුවේ 92 පිටුව) නඩු ගොනුවේ 94 පිටුවේ අධිකරණය විමසන ලද දේ මෙසේය.

ප්‍ර : මේ පිළිබඳව (එනම් රා.පරි/චක්‍රලේඛ පිළිබඳව) තමුන්ට කිසියම් දැන්වීමක් ආයතනය විසින් දැන්වූවාද?

උ : මට කිසිම දැනුම් දීමක් කරලා නැහැ.

කෙසේ වෙතත් මෙම චක්‍රලේඛ මෙම බේරුම්කරණ නඩුවේ ඉල්ලම්කරුවන් දෙදෙනාට ඔවුන් ස්ථිර සේවයේ යෙදෙන හෙයින් බල නොපාන බවය.

මීළඟට ඉල්ලුම්කාර පතිරත්න මහතාගේ සාක්ෂිය ඉදිරිපත් විය. ඒ අනුව පහත කරුණු ඉදිරිපත් විය.

(I) තමන් 1989.03.10 දින සිට කාර්යාල කම්කරු තනතුරකට පත්වීම් ලද බව,

(II) 1998.07.25 වන දින දෙවන ශ්‍රේණියට උසස් වූ බව,

(III) 2002.07.15 වන දින කාර්යාල කම්කරු විශේෂ ශ්‍රේණියට උසස්වීමක් ලද බව,

(IV) 1989.09.15 වන දින වන විට යතුරු ලේඛක තනතුර ආවරණය කළ බව,

''තමා අඛණ්ඩව අවුරුදු 30කට ආසන්න කාලයක් සේවය කළ බව ගරු අධිකරණයට කියා සිටිනවා. ජයභූමි ප්‍රදාන පත්‍ර නිවැරදිව හා පිරිසිදුව යතුරු ලියනය කරන්න ඕන මම ජයභූමි ඔප්පු 10,000කට ආසන්න ප්‍රමාණයක් ගහලා තිබෙනවා. හැම ඔප්පුවකින්ම කොපි 03 ගණනේ විනය පරීක්ෂණ කටයුතු මා විසින් ආවරණය කර තිබෙනවා ඒක පුද්ගල විනිශ්චය සභාවෙන් දුන් සහතික මා ළඟ තිබෙනවා.'' යනුවෙන් යතුරු ලියනය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වය තමාගෙන් වැඩ ගත් ආකාරය (පිටුව 0210 නඩු ගොනුව) සාක්ෂිකරු දීර්ඝ ලෙස අනාවරණය කර සිටී.

වගඋත්තරකාර පාර්ශ්වය තමාගෙන් දිගින් දිගටම බඳවා ගැනීමේ පටිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් පවතීද යන්න මිස තමා කරන ලද සේවය අගය නොකරන බවද කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් ඉතා දුර බැහැර ප්‍රදේශයක සිටිමින් තමාගෙන් වගඋත්තරකරුගේ වාසියට ප්‍රයෝජනයට සාක්ෂිකරුගෙන් වැඩ ගත් බව සඳහන් කරයි. ඊට වගකිවයුතු වනුයේ කොළඹ සිට සේවය කරන නිලධාරීන් පමණක් නොව දුර බැහැර කලාපවල සේවයේ යෙදුනු නේවාසික හා කලාප කළමනාකරුවන්ද බව පැහැදිලි වේ.

ඒ 23 ලෙස සලකුණු කරන ලද ලේඛනය අනුව දිනය 1990.07.22 ලිපිය මාතෘකාව යතුරු ලේඛක තනතුර ලබා දෙන ලෙස ඉල්ලීම යන ලේඛනයේ 111 ඡේදයේ මෙසේ සඳහන් කොට ඇති බව කියා සිටි,

''කෙසේ වුවද කොට්ඨාස කාර්යාලයේ එකී තනතුරට අයත් රාජකාරි තවදුරටත් සාර්ථකව ඉටු කරනු ලැබුවහොත් වසර දෙකක පළපුරුදු කාලයකින් හා වසර තුනක ස්ථිර සේවා කාලයකින් පසුව ඔබගේ ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බැලිය හැකි බව කාරුණිකව දන්වමි.'' යන්නෙන් නේවාසික ව්‍යාපාර කළමනාකරු දන්වා ඇති බව හෙළි කරයි.

මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාගේම ආසන්න බලධාරීන් වූ (අ) නේවාසික ව්‍යාපාර කළමනාකරු සහ (ආ) කොට්ඨාස කළමනාකරු යන දෙදෙනාම වැලිකන්ද ප්‍රදේශයේ සේවය කරමින්

මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාගෙන් යතුරු ලියනය සම්බන්ධ කටයුතු වලදී එනම් (ඒ) ඔප්පු සකස් කිරීම (බී) විනය පරීක්ෂණවල යතුරු ලියන කටයුතු වල යොදවා ගැනීම සහ වෙනත් රාජකාරිමය ලිපි ලේඛන යතුරු ලියනය කිරීම සඳහා යොදා ගෙන ඇති බවට සාක්ෂිකරුවන් දෙදෙනාම කරුණු තහවුරු කොට ඇත. මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා තුළ අධ්‍යාපන සුදුසුකම්වල ඌණතාවක් තිබුණද වර්ෂ ගණනාවක පළපුරුද්ද සලකා යතුරු ලියන තනතුරු සඳහා උසස්වීම් ලබා දීමට කටයුතු කළ යුතුව තිබුණි. එහෙත් ඔවුන්ගෙන් ඒ අවස්ථාව මග හැරී ගොස් ඇත. ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේද මෙම දෙදෙනා සම්බන්ධව ඇස් ඇරී ඇත්තේ මොවුන් බේරුම්කරණය වෙත පැමිණ පසුව වේ. ඔවුන් නීති තර්ක ඉදිරිපත් කොට මෙහි ඉල්ලුම්කරුවන් වරදක් කළ බැව් ඔප්පු කිරීමට උත්සුකව ඇත.

විභාගය අතරතුර කොට්ඨාස කළමනාකරු හෝ නේවාසික කළමනාකරු සාක්ෂි සඳහා කැඳවීමට වගඋත්තරකරුවන් ක්‍රියා නොකළේ මන්ද යන පැනය පැන නඟී. එසේ කැඳවූයේ නම් මෙම විභාගයේ සාක්ෂි වෙනස් වීමට ඉඩ තිබූ බැව මාගේ විශ්වාසයයි.

නැවත ප්‍රශ්න සඳහා මුහුණ දෙන සාක්ෂිකරු (0217 පිටුව නඩු ගොනුව) x19 ලිපියේ දිනය වන විට තමා ගණිතය හැර වැඩ 07යි සම්මාන 03ක් සමග සුදුසුකම් ලබා තිබූ බවත්, එම සුදුසුකම් මත ඉල්ලුම්කරුට යතුරු ලේඛන කටයුතු පවරා තිබූ බවත්, අංශ ප්‍රධානියාගේ සතුටට හේතු වන ලෙස යතුරු ලියන කටයුතු කළ බවත් x9. x20 ලිපිවලින් තහවුරු වේ. ''කෙසේවුවද කොට්ඨාස කාර්යාලයේ එකී තනතුරට අයත් රාජකාරි තවදුරටත් සාර්ථකව ඉටු කරනු ලැබුවහොත් වර්ෂ 2ක පළපුරුදු කාලයකින් හා වර්ෂ තුනක ස්ථිර සේවා කාලයකින් පසු ඔබගේ ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බැලිය හැකි බව ඉතා කාරුණික දන්වමි. ඒ 23 ලේඛනය පැහැදිලි කරයි යන්නෙන් නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ 1990.07.22 ලිපිය තහවුරු කරයි. එම ලේඛනය ඒ 23 ලෙස සලකුණු කොට පවතී.

ඒ 24 ලේඛනය පරිදි පතිරත්න මහතා විනය පරීක්ෂණයකදී යතුරු ලියනය කටයුතුවල නිරතව සිටි බව ඒක පුද්ගල විනිශ්චය සභාව සහතික කොට ඇත. එවැනි පරීක්ෂණ කිහිපයකට සහභාගී වූ බවට ලේඛන රාශියකි. තවද මහවැලි අධිකාරියේ නේවාසික කළමනාකරුගේ ලිපිය එනම් ඒ25 දරන ලිපියෙන් පතිරත්න මහතාගේ යතුරු ලියන කටයුතු සම්බන්ධව පැහැදිලි කරයි.

තවද ඒ25 අංකය යටතේ සලකුණු කරන ලද කොට්ඨාස කළමනාකරු (සිංහපුර) ගේ 2013.10.01 දිනැති 0611 පිටුවේ සඳහන් ලිපිය මගින් ඉල්ලුම්කරු කාර්යාලයේ ලිපි යතුරු ලියනය කරන බව කාර්යාලයට ලැබෙන ලිපි විධිමත්ව ලේඛනගත කිරීම ගෙවීම් වවුචර් භාරදීම, ජයභූමි ඔප්පු සැකසීම ඉඩම් අංශයේ ඉඩම් අවලංගු කිරීම, ඉඩම නිලධාරීගේ අධීක්ෂණය යටතේ පසෙක තැබීමේ රාජකාරි කටයුතු කිරීම සිදු කරන ලද බව පැහැදිලි කරයි.

මෙම කටයුතු කාර්යාල කාර්ය සහායකගේ විෂය කටයුතු නොවන අතර ඉහළ කළමනාකරන නිලධාරියෙකු සතු කටයුතු බව පෙනේ. එවන් කටයුතු රාශියක් මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාගෙන් ඔවුන්ගේ ආසන්න තම උසස් නිලධාරීන් වූ නේවාසික කළමනාකරු සහ කොට්ඨාස කළමනාකරු යන දෙදෙනාගෙන් ලබා ගත්තෙන් ඔවුන් දෙදෙනා තුළ (ඒ.) උසස්වීම් බලාපොරොත්තු (බී) තනතුර ඉහල තත්ත්වයකට පත් කිරීමේ බලාපොරොත්තුව ඇති කරමින් බව පැහැදිලිය.

එහෙත් කොළඹ අග නගරයේ ප්‍රධාන කාර්යාලයක ශීත කාමරවල පහස ලබන වගඋත්තරකාර ආයතනයේ නීති නිලධාරීන්ට හෝ පරිපාලන නිලධාරීන්ට වැලිකන්ද පෙදෙසේ සුළඟේ පහස නොදැනෙන්නට ඇත. ඒ25 (බී) නැමති ලේඛනය අනුව කොට්ඨාස කළමනාකාර එස්. බී. කීරවැල්ල මහතාගේ නිර්දේශ මගින් ''කාර්යාලයේ යතුරු ලේඛකයෙකු හැටියට වසර 5 කට ආසන්න කාලයක් අඛණ්ඩව සේවය කර ඇති ඔහු එම කාලය තුළදී එකී කාර්යය ඉතා මැනවින් ඉටු කරමින් සිටින බවද, 1989 වර්ෂයේ මෙම කොට්ඨාසයේ සිටි යතුරු ලේඛක පී. අමරසිරි මහතාගේ ස්ථාන මාරුවෙන් පසු මේ දක්වා සියලුම යතුරු ලියන කටයුතු කරනු ලබන්නේ පතිරත්න මහතාය.''

තවද ආචාර්ය එම්. වී. ඒ. තෙන්නකෝන් - අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන අයගේ MA/ADM/01/181 හා 2005.09.27 දිනැති ලිපියෙන් සී. එම්. සී. දිල්රුක්ෂිකා මිය 2005.07.12 ලිපියට අනුව 2005.01.01 දින සිට ලිපිකරු තනතුරට පත් කිරීම සහ පාලන නිලධාරී අයි. එම්. බණ්ඩාරනායකගේ ම අනුස/ෂා07 හා 2005.12.16 දින ලිපියෙන් ආරක්ෂක නියාමාකවරයෙකු ලිපිකරු තනතුරට පත් කිරීම (ඒ27 ලිපිය) සහ මේජර් එල්. ඒ. පී. ජයවර්ධන අධ්‍යක්ෂ මහවැලි ආරක්ෂක බලකාය යන අයගේ අංක රහිත 2008.01.11 දිනැති ලිපියෙන් ලිපියේ නම අපැහැදිලිව සඳහන් අයෙකු මහවැලි ආරක්ෂක නියාමක (1) ශ්‍රේණියේ උසස් කිරීම සහ ඒ 28 ලිපියෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් මහින්ද සමරසේකර මයාගේ අංක cpu/08/49 හා 1998.09.14 ලිපියෙන් ඒ. පී. සුනේත්‍රා දමයන්ති මෙය ආරක්ෂක නියාමක II ශ්‍රේණියට පත් කිරීම. මෙම අය A28 (b) ප්‍රතිඵල සටහන අනුව විභාග අංක L7012164 යටතේ එක් විෂයයක් පමනක් සටහන්ව ඇත. මෙම අය මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක MA/ADM/01/181 හා 2005.09.27 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ලිපිකාර තනතුරට පත් කොට ඇත.

මහවැලි අධිකාරියේ ලේකම් ජනරාල්ගේ 1990.05.30 දිනැති එස්අයි/සීඑස්පී/28 දරන ලිපිය මෙහි පළමු පාර්ශ්වය මගින් ඒ 31 ලෙස සලකුණු කරන ලද ලේඛනය මෙම බේරුම්කරණ නඩුවේ මග සලකුණක් මෙන්ම එක්තරා සංධිස්ථානයක් ලෙස සැලකිය හැකිය.

ඒ31 ලේඛනය

(1) ප්‍රතිශෝධනය කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය යන ශීර්ෂයෙන් යුක්තය. එය 1990.05.30 දිනැති ලේඛනය

(2) මහවැලි සංවර්ධන මණ්ඩලය (වත්මන් මහවැලි ඉංජිනේරු කර්මාන්ත ඒජන්සිය) සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ආරම්භයේ සිටම ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටින් ඔබ ඒජන්සියේ නියෝජිතයින්ගේද සහභාගිත්වයෙන් ප්‍රතිශෝධනය කොට උසස් කිරීමේ පටිපාටින්ද සහිතව 1990 අප්‍රේල් මස 06 වන දින පැවති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 75 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරිණ. ප්‍රතිශෝධනය කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටින් ඇතුළත් ලිපි ගොනුවක් සහ මෙම බඳවා ගැනීමේ පරිපාටින් උසස් කිරීමේ පටිපාටින් ක්‍රියාත්මක කිරීමේ දී පිළිපැදිය යුතු කොන්දේසි දක්වමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ මණ්ඩල පත්‍රයෙන් උපුටාගත්

කොටස්ද මේ සමඟ එවමි.''

''මණ්ඩල පත්‍රය මගින් ඉදිරිපත් කර ඇති මෙයට අමුණා එවන කොන්දේසි හා පහත දක්වෙන කරුණු පිළිපදිමින් ප්‍රතිශෝධිත බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටින් 1990.03.01 වන දින සිට ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇති බවද දන්වනු කැමැත්තෙමි.''

පී. ටී. සේනාරත්න - ලේකම් ජනරාල් යන අයගේ අංක එස්ර්සී/ඩීඑස්පී2ටී හා 1990.05.30 දින දරන ලේඛනය X21 වශයෙන් වගඋත්තරකාර පාර්ශ්වය ද සලකුණු කොට ඉදිරිපත් කරන ලද්දකි. ඒ අනුව

(1) මහවැලි සංවර්ධන මණ්ඩලය

(2) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතන දෙකෙහිම නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන්

(අ) ප්‍රතිශෝධනය කොට (අ) උසස් කිරීමේ පටිපාටින්ද සහිතව (A) ප්‍රතිශෝධනය කොට (B) උසස් කිරීමේ පටිපාටියක් 1990.04.05 යන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ මණ්ඩල පත්‍රයක් බැව් සනාථ වේ.

ඉහත කරුණු එනම් (1) ප්‍රතිශෝධනය කරන ලද නව බඳවා ගැනීමේ පටිපාටිය හා (2) උසස් කිරීමේ පටිපාටිය මණ්ඩල පත්‍රයෙන් අනුමත කොට ඇත.

ඉහත කී මණ්ඩල පත්‍රය මගින් මහවැලි ආර්ථික ඒජන්සියේ හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ

A. ස්ථිර පදනම මත සේවයේ යොදවා ගෙන සිටින නිලධාරියෙකු එක් අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කළ පසු අධිකාරිය ඔහුගේ/ඇයගේ රාජකාරි කිරීම ගැන සමාලෝචනයක් කළ යුතු ය.

B. ඔහුගේ/ඇයගේ රාජකාරි කටයුතු සතුටුදායක බැව් වාර්තා වුවහොත් ඔහු/ඇය සිය තනතුරෙහි සිය තනතුරෙහි ස්ථිර කළ යුතු ය. රාජකාරිමය කටයුතු අසතුටුදායක බැව් හෙළි වුවහොත් අදාළ නිළධාරියාගේ සේවය අවසන් කිරීමට පියවර ගත යුතු ය.''

C. ''අභ්‍යන්තර පුරප්පාඩු පිරවීමට අවශ්‍ය අවස්ථා වලදී ප්‍රථමයෙන් ම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඒජන්සි සහ අංශවල සේවකයින්ගෙන් අභ්‍යන්තර අයදුම්පත් කැඳවා සලකා බැලීමටද පියවර ගත යුතු ය.''

''බඳවා ගැනීමේ පරිපාටීන් සංශෝධනය කිරීමේ දී ක්‍රියාත්මක ව පවතින ඇතැම් තනතුරු හා ශ්‍රේණි වලට නියමිත වැටුප් ක්‍රමද ප්‍රතිශෝධනය කර ඇත. එවැනි තනතුරු සඳහා දනට ක්‍රියාත්මකව පවතින අධ්‍යයන/වෘත්තීය සුදුසුකම් හා වෘත්තීය පළපුරුදුකම්ද ප්‍රතිශෝධනය කර තිබිය හැකි බැවින් ප්‍රතිශෝධන වැඩි වැටුප් ක්‍රමවලට එම ශ්‍රේණි වලම දනට සිටින සේවකයින් අන්තර්ග්‍රහණය කිරීමට පෙර ප්‍රතිශෝධිත බඳවා ගැනීමේ පටිපාටින් අනුව නව වැටුප් ක්‍රමය ලැබීමට එවැනි සේවකයින් සුදුසුකම් ලබා ඇද්ද යන්න කමිටුවක් මගින් පරීක්ෂා කර බලා සුදුසුකම් ඇති අය පමණක් ඔවුන් දනට ලබන වැටුප නව ශ්‍රේණියට නියමිත වැටුප් ක්‍රමයේ වැටුප් පියවරකට සම නොවේ නම් එහි ආසන්නතම වැටුප් තලයේ පිහිටුවිය යුතු ය. ප්‍රතිශෝධිත නව වැටුප් ක්‍රමය ලබා ගැනීමට අවම සුදුසුකම් සපුරා නැති අය එම අවශ්‍යතාවය සම්පූර්ණ කරන තුරු ඔවුන් දනට ලබන වැටුප් ක්‍රමයම පෞද්ගලික වන සේ තබා නියමිත සුදුසුකම් සපුරාලීමෙන් පසු ඉහත කී පරිදි නියමිත වැටුප් තලයේ පිහිටුවීමට පියවර ගත යුතු ය.''

ඒ31 (ඩී) වශයෙන් සලකුණු කරන ලද ලේඛනය ඉදිරිපත්ව සියලු කටයුතු එහි ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූයේ නම් මහවැලි අධිකාරියේ සහ මෙම චක්‍රලේඛයෙන් ආවරණය වන කිසිදු ආයතනයක තවදුරටත් කිසිදු තනතුරක වැඩ බලන හෝ උසස්වීම් අපේක්ෂිත දිගු කලක් තනතුරක සේවය කරන ලද එකදු සේවකයෙකු සිටිය නොහැකියි. එහෙත් මෙම චක්‍රලේඛය මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් දෙදෙනා මහ හැර ගොස් ඇත. ඒ සම්බන්ධයෙන් මෙම නඩුවේ වගඋත්තරකාර පාර්ශ්වයේ සියලුම උසස් තනතුරු දරන අයවලුන් මෙන්ම නඩුවට කරුණු ඉදිරිපත් කළ නීතිය අධ්‍යක්ෂ මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුව වෙත උපදෙස් දුන් අන්‍ය නිලධරයන්ද වගකිව යුතුයයි මගේ හැඟීමයි.

වගඋත්තරකරුවන් මෙම ලේඛනය X21 ලෙස ද ඉල්ලුම්කාර පාර්ශ්වය එයම ඒ 31 ලෙස ද සලකුණු කොට ඇත. වගඋත්තරකාර පාර්ශ්වය X21 දරන ලේඛනය හරස් ප්‍රශ්න විමසීමේ දී සිතා මතාම මග හැර ගොස් ඇති අතර වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකාරියගෙන් කිසිදු ප්‍රශ්න විමසීමකින් තොරව අතපසු කොට ඇත.

වගඋත්තරකාර ආයතනයේ ලිඛිත දේශනයෙහි හෝ හරස් ප්‍රශ්න විමසීමේදී මෙම X21 හෙවත් ඒ 31 දරන සලකුණු කරන ලද ලේඛනය සම්බන්ධයෙන් වචනයකුදු සඳහනක් නොකරමින් ඔප්පු කිරීමේ භාරය ඔප්පු නොකරන ලද ලේඛන භාර නොගන්නා ලෙස අධිකරණයෙන් ඉල්ලා ඇත. (පිටු අංක 0558 ලිඛිත දේශනය)

ලිඛිත දේශන සම්බන්ධව නඩු ගොනුවේ පිටු අංක 0549 පිටුවෙහි ''දේශපාලන පළිගැනීම් මත ලබා දෙන පත්වීම් හා උසස්වීම් යන ශීර්ෂය යටතේ එසේ උසස්වීම් ලබාගත් බොහෝ දෙනෙකු සම්බන්ධ විස්තර වගඋත්තරකාර පාර්ශ්වය දක්වා ඇතත් එම ශීර්ෂයෙන් යුත් පත්වීම් දෙස බලත්, එකී බොහෝ පත්වීම්/උසස්කිරීම් අධ්‍යයන සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුදුකම් හෝ නොසලකා කරන ලද පත්වීම් බැව් පැහැදිලිය.

දේශපාලන පළිගැනීම් කමිටුවක් සඳහා මෙම සේවකයින් දෙදෙනා ඉදිරිපත්ව නැත.

මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් හට සෘජුවම බලපාන ලද ඒ 31 හෙවත් X21 දරන චක්‍රලේඛය මගින් මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා මහ හැරී තිබීම සම්බන්ධව එකී චක්‍ර ලේඛයේ සඳහන් සියලු මට්ටමේ විධායක නිලධාරීන් ඇතුලු මහවැලි බී කලාපයේ නේවාසික කළමනාකරු ඇතුළු ප්‍රාදේශීය කළමනාකරුවන්ද වග කිව යුතු බව මාගේ හැඟීමයි.

මෙම ඒ 31 දරන ලේඛනය කොතරම් වැදගත් ලේඛනයක් ද යන්න එහි පිටපත්

01. අධ්‍යක්ෂ : සැ. හා මෙ. ඒ
02. අධ්‍යක්ෂ : ජ. පා. ලේ. කා

03. අධ්‍යක්ෂ : මු. වැ. පා. ක්‍රී හා න. අ
04. අධ්‍යක්ෂ : ඊ. ආ. ව්‍ය. සං. අ
05. අධ්‍යක්ෂ : මහවැලි කේන්ද්‍රය
06. කළමනාකාර භාර අරමුදල
07. අධ්‍යක්ෂ : ම. ආ. සංවිධානය
08. අධ්‍යක්ෂ : ශ්‍රී. ග. හා කී. සං. ව්‍යාපාරය
09. ප්‍රධාන අධ්‍යක්ෂ විධායක : ම. අ. වි. අ.
10. අධ්‍යක්ෂ : පුහුණු කිරීමේ අංශය යන අයවලුන් වෙත යොමු කිරීමෙන් පැහැදිලි වේ. (පිටුව 0490)

කෙසේ වෙතත් මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් දෙදෙනා දැනුවත් කිරීමට කිසිදු බලධාරියෙකු සමත් වී නැත. එනයින්ම මෙම චක්‍රලේඛයෙන් ද ඉල්ලුම්කරුවන් දෙදෙනා මග හැරී ඇත. ඉහත කී පිටපත් යොමු කරන ලද කිසියම් අධ්‍යක්ෂවරයකු යටතේ මෙම ඉල්ලුම්කරුවන් සේවයේ යෙදෙන්නට ඇතැයි යන්න මාගේ හැඟීමයි.

වගඋත්තරකාර ආයතනයේ සාක්ෂිකාරියක වන යූ. ඒ. ශ්‍රියාලතා බ්‍රියටිස් මහත්මිය (පරිපාල නිලධාරිනි) ඒ 31 ලේඛනයේ ප්‍රතිශෝධනය කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනය ලෙස 1990.03.01 බව ඉල්ලුම්කාර පාර්ශ්වයේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කීවාය. (පිටුව 325 කාර්ය සටහන් ප්‍රධාන නඩු ගොනුව)

එම සාක්ෂිකාරියට අනුව (327 පිටුව)

ප්‍ර : මේ ප්‍රතිශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කිරීමේදී මුල් බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් තිබිය යුතුයි කියලා ''A31 (b)'' ඡේදයේ සඳහන් වෙනවාද?

උ : නැත.

තවදුරටත් හරස් ප්‍රශ්න (පිටුව 331)

ප්‍ර : ඔවුන් එම තනතුරේ අවුරුද්දක සේවා කාලයෙන් පසු නැවත සලකා බැලීමේ සුදුසුකම් නැවත සලකා බැලීමක් සිදු කරනවා කියලා මිසක් සුදුසුකම් නැහැ කියලා මේ තනතුරේ රාජකාරියේ යෙදවීම වළක්වා තිබෙනවාද?

උ : රාජකාරි අවශ්‍යතාව අනුව ඕනෑම අයකුගෙන් රාජකාරි කර ගන්න පුලුවන්.

ප්‍ර : එහෙම රාජකාරි ඉෂ්ඨ කරගෙන තියෙනවා. 1989 ඉඳන් රාජකාරි ඉටු කර ගත්තා, ඒකට පත්වීම තමයි ඉල්ලා සිටින්නේ අවුරුදු 03 ක් සේවය කළාට පස්සේ ඒකට දෙන උත්තරය මොකක්ද සේවය හොඳ නම් අවුරුදු 03 කින් සලකා බලනවා කියලා හරි නේද?

උ : ඔව්

ප්‍ර : එහෙම කියලා තිබෙනවා මිසක් කොයි අවස්ථාවක හරි මෙම ඉල්ලුම්කරුවන් මේ තනතුරට සුදුසුකම් නැති නිසා ඒ තනතුරෙන් රාජකාරි නොගෙන ඉවත් කරලා තියෙනවාද?

උ : තනතුරෙන් ඉවත් කරලා නැහැ. රාජකාරි ආවරණය කරන්න පුලුවන් ඕනෑම කෙනෙකුගෙන් එදිනෙද රාජකාරි කර ගන්න කෙනෙක් නැතිවුනාම ඕනෑම කෙනෙක්ගෙන් රාජකාරි කර ගන්න පුළුවන්.

යන්නෙන් මෙම සාක්ෂිකාරිය තමන්ගේ වාසියට තමන්ගේ සිතැඟි ප්‍රකාරව අදහස් ප්‍රකාශ කළද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පනවන ලද කිසිදු නීතියක/ආයතන සංග්‍රහයෙහි කිසිදු මාණ්ඩලික පත්‍රිකාවක නොවන නීති ප්‍රතිපාදනයක් මෙම සාක්ෂිකාරිය පෞද්ගලික මතය ඉදිරිපත් කොට ඇත.

ප්‍ර : 1990 ඉඳන් යතුරු ලේඛක රාජකාරි ආවරණය කළ මෙම ඉල්ලුම්කරුවන් කොයි අවස්ථාවකදී හෝ එම රාජකාරි නිසි ලෙස ඉටු නොකළ හෝ අධ්‍යාපන සුදුසුකම් නොමැතිකම මත හෝ පදනම් කර ගෙන එම තනතුරු වලින් ඉවත් කරලා තියෙනවාද?

උ : ''වැඩ ආවරණයෙන් ඉවත් කරලා නැහැ. ඊට පස්සේ චක්‍රලේඛයක් ආවා රාජ්‍ය පරිපාලනයෙන් මොවුන්ගේ ඉල්ලීම මත අපි එහෙනුත් විමසුවා. මේ අයට ඒක දෙන්න පුලුවන්ද කියලා ඒකට අර්ථකථනයක් දීලා තියෙනවා. '' යන්නෙන් මෙම වග උත්තරකාර ආයතනයේ සාක්ෂිකාරිය සාක්ෂාත් කළාය.

එම සාක්ෂිය මතද මෙම නඩුවේ ඉල්ලුම්කරුවන්ගේ නඩුව තහවුරු කොට ඇත. ඉල්ලුම්කරුවන්ගෙන් වැඩ ආවරණය කරවා ගැනීමෙන් වළක්වා නැති බවත් කීවාය.

විස්තර ප්‍රකාශ ඉදිරිපත් කිරීම

වගඋත්තරකාර පාර්ශ්වයේ විස්තර ප්‍රකාශය 2016.12.09 වන දින ඉදිරිපත් කළ අතර එහි 01 ඡේදය මෙසේ ය. ''1998 වර්ෂයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ප්‍රතිව්‍යුහගතකරණයට ලක් වූ අතර එහිදී මහවැලි අධිකාරියට අනුබද්ධ ආයතනය වූ මහවැලි ආර්ථික ඒජන්සිය ඇතුලු ආයතන කිහිපයක සේවකයින්ට ස්වේච්ඡාවෙන් වන්දි ලබා ඉවත්වීමේ පටිපාටිය ක්‍රියාත්මක කරන ලදී.

2. මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් දෙදෙනා එවකට ඉහත කී මහවැලි ආර්ථික ඒජන්සියේ පත්වීම් ලබා එම ආයතනයට අනුයුක්තව සේවය කළ අතර ඔවුන්ගේ බඳවා ගැනීම් උසස් කිරීම් හා වැටුප් ගෙවීම ඇතුලු පරිපාලන කටයුතු සියල්ල එම ආයතනයේ ප්‍රධාන කාර්යාලය මගින් ඉටු කරනු ලැබිණි.

4 ඡේදය : ''ඒ අනුව 1991 වසරේ මහවැලි ආර්ථික ඒජන්සිය විසින් පවත්වන ලද යතුරු ලේඛක තරඟ විභාගය සම්බන්ධයෙන් (වසර 25 ක් පැරණි) කරුණු ඉදිරිපත් කළ නොහැකි බැව් ගෞරවයෙන් සැල කර සිටිමි.''

5. ''මහවැලි ආර්ථික ඒජන්සියේ ස්වේච්ඡාවෙන් වන්දි ලබා ඉවත් නොවූ සේවකයින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අන්තර්ග්‍රහණය කළ අතර ඉන් අනතුරුව අවස්ථා කීපයකදී මහවැලි අධිකාරිය විසින් ගබඩා සහකාර, යතුරු ලේඛක, ලිපිකරු තනතුරු සඳහා වරින් වර විභාග පවත්වා උසස් වීම් ලබා දී ඇතත් මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා එම උසස්වීම් ලබා ගැනීමට සමත් වී නොමැත.''

6. කෙසේ වෙතත් පළමු පාර්ශ්වය තම අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා අප්‍රමාදිව ඉදිරිපත් වී නොමැති බැවින් ''undue

delay'' සිද්ධාන්තය යටතේ මෙම නඩුව මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභා විය යුතු බව ගරු අධිකරණයේ අවධානයට යොමු කොට සිටිමි.

7. ඒ අනුව පළමු පාර්ශවයේ ඉල්ලීම කාලාවරෝධී වී ඇති බවද ගෞරවයෙන් සැළ කර සිටිමි.

8. ඒ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලමි.

මෙසේ ඉල්ලා සිටිනුයේ වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥ සහ අධ්‍යක්ෂ නීති යන අය වේ.

මෙසේ වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලා සිටියද, ඉල්ලුම්කරුවන් දෙදෙනාගේ ඉල්ලීම් එසේ කාලාවරෝධයට ලක් නොවන බවට සාක්ෂි ඇත.

ඉල්ලීම් කාලාවරෝධයට යටත් නොවන බවට සාක්ෂි

ඒ16 දරන 1993.04.02 දිනැති සේවක ප්‍රශ්න පිළිබඳව පැවති මහවැලි ජංගම සේවය - 1993.02.06

මෙම ලිපියේ ජංගම කාර්යාල දිනයේ කළ නිගමනයන් යන අනුශීර්ෂය යටතේ :-

01. ටී. එම්. නන්දසේන මහතා කාර්යාල සහායක - දැනට සිටින ලිපිකරු මහතාට අමතරව පවතින රාජකාරීන් ආවරණය කිරීම සඳහා ඉඩම් නිලධාරී ආර්. එම්. බී. ජේ. ද සිල්වා මහතා විසින් කළ ඉල්ලීම කොට්ඨාස කළමනාකාර සහ කළමනාකරණ පරිපාලන සමග සාකච්ඡා කර නිගමනය කර ගත් පරිදි කඩිනමින් ටී. එම්. නන්දසෝම මයා ඉඩම් කටයුතු සඳහා අනුයුක්ත කිරීමටත්, ඉඩම් කටයුතු ආවරණය කිරීමට ලිපිකරුවකු වශයෙන් ලිපිකරු රාජකාරී පවරා දීමටත් සම්පූර්ණ වැඩ ප්‍රමාණය පිළිබඳව ඉඩම් නිලධාරී විසින් ලබා දිය යුතු බවටත් තීරණය විය.

කොට්ඨාස කළමනාකාර/දම්මින්න.
කේ. අ. සී. ද සිල්වා

2. අතිරේක ලේකම් (පාලන හා මුදල්) හා අසාධාරණයට ලක් වූවන්ගේ ප්‍රතිලාභ ඌණ පූරණය කිරීමේ අනුකමිටු ලේකම්ගේ අංක මසපඅ/නිඅ/07/පොදු අංකයෙන් යුත් 2015.06.01 දිනැති අසාධාරණයට ලක් වූවන්ගේ ප්‍රතිලාභ ඌණ පූර්ණය කිරීමේ අමාත්‍ය මණ්ඩල වැඩසටහන මැයෙන් ඒ 18 දරන ලිපිය ප්‍රකාරව ටී. එම්. නන්දසෝම මහතාගේ ඉල්ලීම සඳහන් වේ.

3. ඒ22 ලිපිය

වැඩ බලන කොට්ඨාස කළමනාකාර/දම්මින්න ආර්. ඒ. එස්. ජයසිංහ මහතාගේ නිර්දේශය වනුයේ ඔහුට ''ඔහුට මෙම තනතුර ලබාදීමට සුදුසු බව නිර්දේශ කරමි.'' යනුවෙන් සිංහල යතුර ලේඛක තනතුර සඳහා අයදුම්පත්‍රය 1990.12.12 දින නේවාසික කළමනාකාර මහතා වෙත ඉදිරිපත් කරමින් නිර්දේශ කොට ඇත.

ඒ23 දරන ලේඛනය

මෙම ලේඛනය නේවාසික ව්‍යාපාර කළමනාකාර ජී. ජී. ඩබ්. ගුණතිලක මයා විසින් 1990.07.22 වන දින කොට්ඨාස කළමනාකාර මහතා මගින් එච්. පී. කේ. යූ. පතිරත්න - කාර්යාල කම්කරු අමතන ලද යතුරු ලේඛක තනතුර ලබා දෙන ලෙස ඉල්ලීම මැයෙන් යුත් ලිපියකි. එහි 3 වන ඡේදය මෙසේ ය. එනම් ''කෙසේ වුවද කො : කාර්යාලයේ එකී තනතුරට අයත් රාජකාරි තවදුරටත් සාර්ථකව ඉටු කරනු ලැබුවහොත් වර්ෂ දෙකක පලපුරුදු කාලයකින් හා වර්ෂ 3ක ස්ථිර සේවා කාලයකින් පසුව ඔබගේ ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බැලිය හැකි බව ඉතා කාරුණිකව දන්වමි.''

ඒ25 දරන ලේඛනය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) වෙත කේ. ඒ. ජයසිංහ කිරිඇල්ල නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් 2015.09.29 වන දින BHM/PF2051 යන සමාංකයෙන් යුත් යතුරු ලේඛක තනතුර හිඟ වැටුප් සහිතව ලබා ගැනීම යන ශීර්ෂයෙන් යුත් ලිපියේ උක්ත කරුණට අදාළ ඔබගේ අංක MA/ADM/04/09 ii හා 2015.08.19 ලිපිය සම්බන්ධ පිළිතුරු ලිපියේ මෙසේ දක්වේ.

''ඒ අනුව එච්. පී. කේ. යූ. පතිරත්න මහතා නමින් නඩත්තු කරනු ලබන පෞද්ගලික ලිපිගොනුවට අනුව පහත කරුණු ඉදිරිපත් කරමි.''

I. 1998.11.01 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යාල කම්කරු ස්ථිර පත්වීම් ලබා ඇත.
II. 1989.09.10 වන දින සිට මෙම කලාපයේ දම්මින්න කොට්ඨාස කාර්යාලයේ යතුරු ලේඛක කටයුතු කළ බවට එවකට සිටි කොට්ඨාස කළමනාකාරවරුන් විසින් සහතික කර ඇත.
III. ඔහු විසින් යතුරු ලේඛක තනතුර ලබා දෙන ලෙස නේවාසික ව්‍යාපාර කළමනාකාර (බී කලාපය වෙත ඉදිරිපත් කරන ලද ලිපි)
IV. ඉහත ඉල්ලීමට අනුව එවකට සිටි නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් ඔහු වෙත ඉදිරිපත් කළ ලිපිය
V. යතුරු ලේඛක සිංහල III ශ්‍රේණිය වේග පරීක්ෂණයකට සහභාගිවීමට කැඳ වූ ලිපිය
VI. යතුරු ලේඛක (සිංහල) සම්මුඛ පරීක්ෂණයකට කැඳ වූ ලිපිය
VII. ඔහු විසින් විනය පරීක්ෂණයන් යතුරු ලියනය කිරීම සඳහා සහභාගි වූ බවට සේවා සහතික
VIII. කලාපයේ ගොවීන් වෙත බැහැර කිරීම සඳහා ජයභූමි ප්‍රදාන පත්‍ර යතුරු ලියනය කිරීමේ ලිපි

ඉහත ලියවිලිවලට අනුව මෙම සේවක මහතා කාර්යාලීය කම්කරුවකු ලෙස සේවයට බැඳුනද 1989 වර්ෂයේ සිට මේ දක්වා යතුරු ලේඛක කටයුතුවල නිරත වී සිටින අයකු බව තහවුරු කරමි. යන නි. නේ. නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ලිපිය දෙස් දෙයි.

දෙපාර්ශ්වය විසින් සිය ලිඛිත දේශන සමග ඉදිරිපත් කරන ලද ලේඛන

(අ) ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් වූ ලේඛන :-

A1 දරන ලේඛනය : ගරු මහවැලි සංවර්ධන අමාත්‍ය ගාමිණී දිසානායක මහතාගෙන් යතුරු ලේඛක තනතුරු ඉල්ලා සිටීම මැයෙන් උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුගේ 1998.08.27 දිනැති ලිපිය.

A2 දරන ලේඛනය : ව්‍යාපාර පරිපාලන නිලධාරි විසින් මහවැලි සංවර්ධන ඒජන්සියේ කොට්ඨාස කළමනාකාර මහතාට ලියන ලද 1990.03.23 දිනැති ලිපියෙන් ටී. එම්. නන්දසෝම මහතා යතුරු ලියන කටයුතුවල නිරත කිරිමටත් අමතර ගෙවීමක් සඳහා ප්‍රධාන කාර්යාලයට දන්වා ඇති බවත් හෙළි කරන ලිපිය.

A3 දරන ලේඛනය : මහවැලි ආර්ථික ඒජන්සියේ අධ්‍යක්ෂ, මධ්‍යම පිරිස් ඒකකය වෙත 1994.06.30 දින පී. ජයවික්‍රම කළමනාකාර පරිපාලන යන අය ලියන ලද මෙහි

1. මෙම දෙදෙනාම 1991 සැප්තැම්බර් මස ප්‍රායෝගික පරීක්ෂණයෙන් සුදුසුකම් සපුරා ඇති වුවද, යතුරු ලේඛක තනතුරෙහි පිහිටුවා නැති බවත්, දෙදෙනාම කාර්යාල කාර්ය සහායක තනතුරුවලට පත් වුවද නන්දසෝම මහතා 1990 සිට පතිරත්න මහතා 1989 සිටද යතුරු ලියන කටයුතුවල නිරත බවත්, මහවැලි බී කලාපයේ එවකට යතුරු ලියන පුරප්පාඩු 8ක් පවතින බවත්, සඳහන් ලිපිය.

A6 දරන ලේඛනය : කොට්ඨාස කළමනාකාර නිමල් මුතුනායක මහතා 2003.02.21 දින නේවාසික ව්‍යාපාර කළමනාකාර ''B'' කලාපය වැලිකන්ද වෙත මෙහි ඉල්ලුම්කරුවන් දෙදෙනා හට යතුරු ලේඛක හෝ ලිපිකාර තනතුර ලබාදීම සඳහා ඉල්ලීම.

A8 දරන ලේඛනය : මෙය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සහ සියලු සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් අමතන ලද 2007.07.17 දිනැති රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් ස්ථිර කිරීම යන ශීර්ෂයෙන් යුත් ලිපිය 2006.12.06 දිනැති රා. පරි. චක්‍රලේඛ අංක 21/2006 දරන චක්‍රලේඛයේ (1) වන ඡේදය වෙනුවට මෙහි 'ආ' ඡේදය ආදේශ කොට ඇත. එනම් ''අදාළ තනතුරේ බඳවා ගැනීමේ පරිපාටියේ නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති වුවද පුරප්පාඩු තනතුරක 2006.11.01 දිනට සතුටුදායක සහ අඛණ්ඩව අවුරුදු 03ක සේවා කාලයක් සපුරා ඇති සේවකයින්ට රජයේ පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන පුහුණු වැඩ සටහනක සහභාගී වී සහතිකයක් ලබා ගැනීමෙන් පුරප්පාඩු තනතුරුවල සේවා ස්ථිරත්වය ලබා දිය හැකි ය.

මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් දෙදෙනාට ද 'B' කලාපයේම සේවය කර ඇති යතුරු ලියන කටයුතු සැලකිල්ලට ගෙන ඔවුන් ඉල්ලා සිටින ඊළඟ තනතුර ලබාදීමට ඉඩ තිබිණ. තාවකාලික ආයතනයක පුහුණුව වෙනුවට එම ආයතන සේවය කිරීම සලකා කටයුතු කිරීමටත් එම ආයතනයේම උසස් නිලධාරීන්ගේ ප්‍රශංසා ලිපි ආදිය මහවැලි අධිකාරිය මගින් රා. පරි. ලේකම් වෙත ඉදිරිපත් කොට අනුමත කර ගැනීමටද ඉඩක් පවතින්නට ඇත.

A16 දරන ලේඛනය : නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ 2008.07.23 දිනැති විධායක අධ්‍යක්ෂ (පාලන හා මුදල්) ලංකා මහවැලි අධිකාරිය කොළඹ වෙත යතුරු ලේඛක තනතුර ලබා දෙන ලෙස ඉල්ලීම, මැයෙන් යුත් ලිපිය නන්දසෝම මහතා යතුරු ලේඛන පුරප්පාඩු පවතින 'B' කලාපය සඳහා පත් කරන ලෙස ඉල්ලීම.

A15 දරන ලේඛනය : කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවට නියෝජ්‍ය කම්කරු කොමසාරිස්තුමාගේ IR/22/29/2012 අංක දරන 2013.03.22 දිනැති විධායක අධ්‍යක්ෂ (පාලන හා මුදල්) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ටී. එම්. නන්දසෝම මහතා හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරවුල මැයෙන් යුත් ලිපියකි. එම ලිපිය

a. 1991 යතුරු ලේඛක තනතුරට බඳවා ගැනීමේ පරීක්ෂණයෙන් සමත් බව,

b. 2010 දී ගබඩා භාරකාර සඳහා පැවති පරීක්ෂණයෙන් සමත් බව,

c. 1998 වර්ෂයේ දී වන්දි ලබා ස්වේච්ඡාවෙන් ඉවත්වීමට අවස්ථාව තිබුණද ඊට ආයතනය විසින් ඉඩ ලබා නොදීම.

d. අතිරික්ත සේවකයෙක් ලෙස ගණන් නොගැනීම මත ස්වේච්ඡාවෙන් ඉවත්වීමට ඉඩ නොදුන්නද, 2011 මැයි ලිපියකින් ස්ථාන මාරු කරන ලද්දේ අතිරික්ත සේවකයෙක් ලෙස ගණන් ගැනීම නිසා බවද,

e. ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් අනුව වාණිජ හා ගිණුම් සහ ප්‍රාග් වෘත්තීය සම්මාන සමාර්ථ ලබා ඇතත් ගණිතය සම්බන්ධයෙන් සම්මාන සාමාර්ථ ලබා නැති බවට ආයතනයේ ඉදිරිපත් කරන කරුණු සාවද්‍ය බව හෙළි කරයි.

කෙසේ වෙතත් මහවැලි අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි නියෝජිත මහතා කියා සිටියේ කම්කරු කොමසාරිස්තුමා යම් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් ඒ ගැන යළි සලකා බැලීමක් කළ හැකි බවයි.

ඒ අනුව ඉහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කර මෙම ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කිරීම යෝග්‍ය බව පෙනී යයි. මේ සම්බන්ධයෙන් ඔබ ගන්නා තීරණය මා වෙත සති 2ක් තුළ දන්වා සිටීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එයට පිළිතුරක් වර්ෂ 5 ගත වී ඇත්ද මෙතෙක් ලබාදීමට මහවැලි අධිකාරිය සමත්ව නැත. එනයින් මෙම අයගේ ඉල්ලීම උවමානවෙන්ම මහවැලි අධිකාරියේ සියලු වගකිවයුත්තන් මඟහරින ස්වභාවයක් පවතින බැව් පැහැදිලිය.

මෙතෙක් ඉල්ලුම්කරුවන් වන ටී. එම්. නන්දසෝම හා එච්. පී. කේ. යූ. පතිරත්න යන දෙදෙනා සම්බන්ධව වගඋත්තරකාර ආයතනයේ ස්ථාවරය හා ඉදිරිපත් කරන ලද ලේඛන මත තහවුරු වන දත්ත විමසා බලමු.

X1 ලේඛනය : මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා 21/2006 (1) යන චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට නොවැටේ නම් යතුරු ලේඛක තනතුරේ වැඩ බැලීම හා එහි කාර්යක්ෂමතාව ඇගයීමට ලක් කොට ස්ථිර යතුරු ලේඛක තනතුරට පත් කිරීමට හැකියාව තිබිණ.

එම ලේඛනයේ 03 ඡේදය මත ''ස්ථිර සේවකයින්ගේ තනතුරුවල සංශෝධනයක් කළ නොහැකි බව සඳහන් කර ඇතත් අධිකාරියේ ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ නිර්දේශ හා සේවා අගය කිරීමේ ලේඛන සැලකිල්ලට ගෙන මෙම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම කෙරෙහි තම අවධානය යොමු කරවීමට ඉඩ තිබිණ. එහෙත් එසේ සිදු කොට නැත.

X5 ලේඛනය : අනවසරයෙන් කාර්යාලයෙන් බැහැරව සිටීම හා තරාතිරම ඉක්මවා කටයුතු කිරීම සම්බන්ධව අවවාද ලිපියකි.

X6 ලේඛනය : දින 05 ක් නොදන්වා සේවයට වාර්තා නොකිරීම සම්බන්ධව දින 05 ක වැටුප් අය කර ගන්නා බව දැන්වීම.

X12 ලේඛනය : එච්. පී. කේ. යූ. පතිරත්න මහතා 1 වන ශ්‍රේණියේ කා.කා.ස තනතුරට උසස් කිරීම.

X13 ලේඛනය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවකයින් සඳහා ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත්වීම සඳහා පරිපාටිය.

X14 } ලේඛනය හා
X35 } දක්වා ලේඛනය මෙම විභාග කටයුතු සඳහා සංස්ථාව බලනොපාන ලේඛන වේ.

X36 ලේඛනය : නන්දසෝම මහතා කාර්යාල කාර්ය සහායක 1 ශ්‍රේණියට උසස් කිරීම.

X49 ලේඛනය : පතිරත්න මහතා 1 වන ශ්‍රේණියට උසස් කිරීම.

X50 ලේඛනය : පතිරත්න මහතාගේ රාජකාරි ලැයිස්තුව

* ලේඛන භාරව කටයුතු කිරීම
* පොත් බැඳීම
* අනුපිටපත් යන්ත්‍ර ඡායා පිටපත් යන්ත්‍ර වෙනත් කාර්යාල උපකරණ ක්‍රියාකිරීම
* පණිවිඩ ගෙන ඒම හා ගෙන යාම
* ලිපි බෙදාහැරීම
* ලිපිගොනු නඩත්තු කිරීමට සහාය දීම
* සෝපාන යන්ත්‍ර ක්‍රියා කරවීම
* කාර්යාලයේ සහ කාර්යාල පරිශ්‍රයේ දේපල ආරක්ෂා කිරීම
* කාර්යාලය හා අවට අලංකාර කිරීම
* සනීපාරක්ෂක කටයුතු ප්‍රථමාධාර කටයුතු
* යතුරු රාජකාරි
* කාර්යාල නිලධාරින්ට සංග්‍රහ කටයුතු

මේ අනුව විශාල වගකීම් රැසක් භාර දී තිබෙනු දක්නට ඇත.

ඉල්ලුම්කරුවන්ගේ සාක්ෂි හා වගඋත්තරකරුවන්ගේ සාක්ෂි සමාලෝචනය :

මේ සඳහා දෙපාර්ශ්වයම කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු ලෙස :-

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ''B'' කලාපයට අනුයුක්තව කාර්යාල කාර්ය සහායක ලෙස සේවය කරන ටී. එම්. නන්දසෝම සහ එච්. පී. කේ. යූ. පතිරත්න වන කනිෂ්ඨ සේවකයන් යතුරු ලේඛක තනතුරු සඳහා පත් කිරීමට 1991 වර්ෂයේ පවත්වන ලද පරීක්ෂණයෙන් සමත්ව තිබියදී එම තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී ඇත්ද? යන්න සහ එලෙස අසාධාරණයක් සිදුව ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමි විය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

යොමුව පරිදි මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් දෙදෙනා 1991 වර්ෂයේ පැවති පරීක්ෂණයෙන් සමත් වී සිටීම පිළිගැන්වී ඇත. ඒ සම්බන්ධයෙන් දීර්ඝ පරීක්ෂණයක් අවශ්‍ය නොවුවත් දෙපාර්ශ්වයටම ඒ බව ඔප්පු කිරීමට ලේඛන ගත හා වාචික සාක්ෂි ප්‍රයෝජනයට ගෙන ඇත. දැනට පවතින ගැටලුව වන්නේ යතුරු ලේඛක තනතුර ලබා නොදීමෙන් ඔවුනට අසාධාරණයක් සිදුව ඇද්ද එසේ නම් ඔවුන් දෙදෙනාට ලැබිය යුතු සහන කවරේද යන්නයි.

ඉල්ලුම්කාර පාර්ශ්වය තමන් දෙදෙනා හට යතුරු ලේඛක තනතුර ලබා නොදුන්නද වගඋත්තරකාර මහවැලි අධිකාරිය දේශපාලන පළිගැනීම් මතයයි කියමින් පහත පෙනෙන ආකාරයට පත්වීම් ලබාදීම ඉල්ලුම්කරුවන් අභිබවා කටයුතු කිරීමක් බව ඔප්පු කොට ඇත. මෙසේ තනතුර ලබා දුන් ආකාරය මෙසේ දක්වමු.

| පැවති තනතුර | නව තනතුර | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 01. ආරක්ෂක නියාමක එම්. එම්. සී. දිල්රුක්ෂි මිය | ලිපිකරු තනතුර | අ.පො.ස සා පෙළ සම්මාන 03ක් සමග විෂය 4 සාමාර්ථය |
| 02. ආරක්ෂක නියාමක කේ. ඩබ්. අනූෂා ගුණසිංහ | ලිපිකරු තනතුර | අ.පො.ස. සා පෙළට පෙනී සිටීම |
| 03. ආරක්ෂක නියාමක ඊ. ජී. එස්. දමයන්ති මිය | ලිපිකරු තනතුර | අ.පො.ස. සා පෙළ අසමත් |
| 04. ආරක්ෂක නියාමක ඩී. ඩී. ඩී. එම්. විජේදාස | ලිපිකරු තනතුර | අ.පො.ස සා පෙළ විෂයන් 05 ක් සමත් වීම. |
| 05. ඒ. ඒ. ඩබ්. අමරකෝන් | ලිපිකරු තනතුර | අ.පො.ස සා පෙළ සම්පූර්ණ කොට නැත |

මෙම උසස්වීම් ලබා දීමට පාත්‍ර වූ දේශපාලන පළිගැනීම කුමක් ද, කුමන ලෙසින් ද යන්න අපැහැදිලි ය. දේශපාලන පළිගැනීම් මත අධ්‍යාපන හා මූලිකවම තනතුරු වලට අදාළ සුදුසුකම් යටපත් වන්නේ දැයි පරිපාලන නිලධාරිනියගෙන් විමසීමේ දී ඇයගේ පිළිතුර වී ඇත්තේ දේශපාලන පළිගැනීම් මත දීලා තියෙන්නේ

අධ්‍යාපන සුදුසුකම් හෝ පළපුරුද්ද බලලා නැ. අමාත්‍ය මණ්ඩල තීරණයකට දීලා තියෙන්නේ.

කරුණු කෙසේ සඳහන් කළ ද ඒ - 31 දරන ලේඛනයෙහි දැක්වෙන කොන්දේසි වලට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නිම කර ඇති කොන්දේසි යන උප ශීර්ෂය යටතේ ඇති ඡේදය උපයෝගී කොට ගෙන ඉල්ලුම්කරුවන් පුරප්පාඩු ආවරණය කරමින් සිටි තනතුරු ඔවුන් දෙදෙනාට ලබා දීමට පුළුල් හැකියාවක් තිබුණත් වගඋත්තරකාර පාර්ශ්වය එය මග හැර ඇත.

එක් අවුරුදු සේවා කාලයකින් පසු ඉල්ලුම්කරුවන් යොදවන ලද ස්ථිර තනතුරේ සේවය පිළිබඳ සමාලෝචනයක් කොට සේවය සතුටුදායක නම් තනතුර ස්ථිර කිරීමට ද අසතුටුදායක නම් ඔවුන් දෙදෙනා සේවයෙන් ඉවත් කිරීමට ද ඉඩ තිබිණ.

එකම ආයතනයේ වැඩ කළ දෙපිරිසකට දෙයාකාරයෙන් සැලකීම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 12(1) වගන්තියට ද පටහැනි කරුණකි. මේ අනුව යොමුවේ සඳහන් පරිදි මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් දෙදෙනා වන ටී. එම්. නන්දසෝම හා එච්. පී. කේ. යූ. පතිරත්න යන කණිෂ්ඨ සේවකයින් දෙදෙනා යතුරු ලේඛක තනතුර සඳහා පත් කිරීමට 1991 වර්ෂයේ පවත්වන ලද පරීක්ෂණයෙන් සමත්ව තිබිය දී එම තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී ඇත යන්න බේරුම්කාර මාගේ මතය වේ. එය සනාථ කිරීමට දෙපාර්ශවයෙන් කරුණු රාශියක් ඉස්මතු කොට ගෙන ඇත.

එසේ හෙයින් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයක් වනුයේ පහත සඳහන් නිර්දේශ වේ.

එනම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 'බී' කලාපයකට අනුයුක්ත කාර්යාල කාර්ය සහයකයින් ලෙස සේවය කරන ටී. එම්. නන්දසෝම මහතා සහ එච්. පී. කේ. යූ. පතිරත්න මහතා ද කණිෂ්ඨ සේවකයින් ලෙස අයදුම්පත් කැඳවන ලදුව වේග හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වූ 1991 සැප්තැම්බර් මස 21 දින සිට යතුරු ලේඛක හෝ ලිපිකාර තනතුරු වල පිහිටුවා හිඟ වැටුප්, වැටුප් වර්ධක සහ වෙනත් රජයේ අනුමත දීමනා ද සමග ස්ථිර තනතුරු වල යෙදවීමට වගඋත්තරකාර මහවැලි අධිකාරියට නියෝග කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක කාලයක් තුළ ක්‍රියාත්මක විය යුත්තේ ය.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

බේරුම්කරු.

06 - 713

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.